# ගොවීන්ගේ කතා පුවත්

අනුරාධපුරය, වවුනියාව සහ මහනුවර යන පළාත්වල ගොවි මහතුන්ට ගොවිතැන් කර ගෙන යනකොට මුහුණ දෙන්න වෙන එක එක ප්‍රශ්න ගැන ගිය වතාවේ සඟරාවේ පළමු වැනි කලාපයේදී සාකච්ඡා කළා. මේ සැරේ අපි ගිහින් කතා කළේ ගාල්ල, මාතර, රත්නපුරය, කුරුණෑගල, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ යාපනය පළාත්වල ගොවි මහත්වරු කීප දෙනෙක් එක්කයි. ගොවිතැන් කටයුතු වැඩි දියුණු කරන්න උදව්වක් හැටියට ආණ්ඩුව අනුමත කර තිබෙන ණය මුදල් එහෙම ගොවි මහතුන්ට කරදරයක් නැතිව ලබා ගන්න පුළුවන්ද? සමුපකාරය, ගොවි කාරක සභාව සහ පලදවර්ධන කමිටුව වාගෙ සමිති සමාගම් වලින් තමන්ට ඕන කරන සේවය කලට වේලාවට නියම විදියට ලැබෙනවාද? මේ සමිති සමාගම් වලින් වඩාත් හොඳ සේවයක් ඉටු කරවා ගන්න ගොවි මහත්වරු ඉදිරිපත් කරන යෝජනා මොනවාද? ගොවිතැන් කටයුතු ගැන වෙනදාට වඩා උනන්දුවක් තියෙනවාද? එහෙම නම් ගොවි කටයුතු ගැන දක්වන ඒ උනන්දුව හින්ද ගොවි මහතුන්ගේ තත්වය දැන් වෙනස්වෙලා තියෙනවද? තමන්ගෙ පළාත්වල දියුණුවට නොයෙක් වැඩ පිළිවෙල ඇති කරන කොට තමන්ගේ අදහස් ඉදිරිපත් කරන්න වෙනදාට වඩා දැන් ගොවි මහතුන්ට අවස්ථාවක් ලැබෙනවාද? මේ වගෙ කරුණු ගැන ඉහතකී පළාත්වල ගොවි මහතුන් සමග සාකච්ඡා කළා. ඇත්ත වශයෙන්ම පළාතේ ගොවි කටයුතු ගැන වගේම පළාතේ දියුණුවට කළ හැකි වැඩපිළිවෙලවල් ගැනත් හොඳ අවබෝධයක් ඇතුව ඒ අය අප සමග කිවූ කතා පුවත් තමයි, හුඟක් කෙටියෙන් පහත දක්වා තියෙන්නෙ.

**මේ ලිපිය පිළියෙල කරන්නේ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කාර්ය මණ්ඩලයේ අය එක එක පළාත්වල ගිහිල්ල, ගොවි මහත්වරුන් හමුවෙලා ඒ අය එක්ක සාකච්ඡා කරලයි. ගොවි මහත්වරු මුහුණ දෙන ප්‍රශ්න ඒ අය කියන විදියටම මෙහි පෙන්වා තියන හින්ද, ඒ ඒ ප්‍රශ්න ගැන අවබෝධයක් ලබාගෙන ඒවා විසඳන්න කටයුතු කරන සංවර්ධන සැළසුම්කරුවන්ට අපේ මේ ව්‍යායාමය උපකාරයක් වේවි යැයි අපි බලාපොරොත්තු වෙනව.**

ගාලු දිස්ත්‍රික්කයේ, වංචාවල, කදුරුදූවෙ **කේ. එල්. කරුණාදස** මහතා කුඹුරු අක්කර 3 1/2 කුත් ගොඩ ඉඩම් අක්කරයකුත් වගා කරගෙන ගොවිතැනින් ජීවිකාව හරිහම්බ කරගන්න කෙනෙක්. මෙයින් කුඹුරු අක්කර 2 ක් ඔහු වැඩ කරන්නේ අඳයටයි. දකුණු පළාතේ හුඟක් කුඹුරු වල තියෙන විදියට කරුණාදස මහතාත් තමන්ගේ කුඹුරේ ඕවිටේ ලුනු, මැකරල්, බණ්ඩක්කා ආදිය වවල තියෙනව. මේ වගේ සුළුවෙන් එළවලු ආදිය වවා ඒවා ගෙදර ප්‍රයෝජනයට ගන්නා බව කරුණාදස මහතා පැවසුව.

ඔහුගේ කුඹුරු වැඩ කිරීමට තාත්තත්, මල්ලිත් ඔහුට උදව් වෙනව. කුඹුරු හැමට කරුණාදස මහතා යාළුවන්ගෙන් ට්‍රැක්ටර් ලබා ගන්නව. කාලෙකට එහෙම ට්‍රැක්ටර් ලබා ගන්න අමාරු හින්ද ඒ පළාතේ අත් ට්‍රැක්ටර් මධ්‍යස්ථානයක් පිහිටුවනවනම් එය හුඟක් ප්‍රයෝජනවත් බවයි ඔහු කියන්නෙ.

ගොවිකාරක සභාව අක්කර බද්ද එකතු කරනව හැරෙන්න ගොවි කටයුතු ගැන වැඩි උනන්දුවක් නොදක්වන බව ඔහු පැවසුව.

කරුණාදස මහතා පෝර, වල් පැලෑටි විනාශ කරන බෙහෙත් වර්ග ආදිය ලබාගන්නෙ පිළාන-මැටරඹ විවිධ සේවා සමුපකාර සමිතියෙන්. ඔහු කියන වියදිට පෝර, බෙහෙත් ආදිය ඕන කරන වෙලාවට සමුපකාරයෙන් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා මේ වතාවේ වල්පැලෑටි වඳ කර ගන්නටත් ඔහුට පුළුවන් වුනේ නැහැ. කරුණාදස මහතා වැඩ කරන්නේ වැහි ලැබෙන හැටියටයි. ඒ හින්ද බෙහෙත් වර්ග ආදිය වෙලාවට නොලැබුනොත් ඒක ලොකු අවහිරයක්.



කුඹුරේ ඔවිට එළවළු වැවීමට යොදවා හැම බිම් අඟලක්ම වවන්න උත්සාහ කරන කරුණාදස මහතා

කුඹුරු අක්කරයක් වපුරන්න රු. 450 ක් විතර වියදම් වෙන බව කරුණාදස මහතා කිව. ඔහු ගිය කන්නයේ වැඩ කරන්න නම් ණය ගත්තෙ නැහැ. ඒත් මේ කන්නෙට රු. 750 ක් බැංකුවෙන් ණය ගත්තෙ අස්වැන්න කපා පාගා ගත්තම ආපහු ගෙවන බලාපොරොත්තුවනේ. අක්කරයකට සාමාන්‍යයෙන් වී මලු 40 ක (බුසල් 60 ක් පමණ) විතර අස්වැන්නක් ලැබෙන බව කරුණාදස මහතා පැවසුව. සමුපකාරයට වී විකුණන්න ඔහුට කරදරයක් නැහැ.

හාල් සලාකය අඩු කිරීමෙන් ඔහුට කිසිම අමාරුවක් නැතත් ඒ පළාතේ දුප්පත් අයට එය උහුලන්න බැරි දෙයක් බව කරුණා- දස මහතා පැවසුව. ඔහු කියන හැටියට හාල් මිල පාලනය කළොත් හොඳයි. දැන් ගොවි තැනට තියෙන උනන්දුව තව අවුරුදු දෙක තුනක් ඒ විදියටම තිබුනොත් ගොවින්ටත් අනෙක් අයටත් සරු කාලයක් ඇති වේවියයි ඔහු විශ්වාස කරනව.

කරුණාදස මහතා කිවේ මයියොක්කා, බතල ආදිය ඒ ප්‍රදේශයේ පහසුවෙන් වවන්න පුළුවන් බවයි. ඔහුගේ ගොඩ ඉඩමේ ඔහු කජු, කෝපි, ගම්මිරිස් ආදියත් වගා කරල තියෙනව. ඒ වුනත් ඒ පළාතේ අනෙක් අයට තියෙන ලොකුම ප්‍රශ්නයක් තමයි, ඉඩම් නැතිකම. කරුණාදස මහතා පැවසුවේ, ගොවිතැන් කටයුතු කරගෙන යන්න උනන්- දුවක් තිබුණත් ඉඩම් නැති හින්ද මොනම දෙයක් වත් වගා කර ගන්න පුළුවන් කමක් නැති හුඟක් අය ඒ පළාතේ සිටින බවයි.

× × ×

**වංචාවල හප්පාවන, හදිමුල්ලේ, අයි. ජී. ජයසේන** මහතාගේ වයස අවුරුදු 38 යි. ඔහු දරුවන් හය දෙනෙකුගේ පියෙක්. 1957 සිටම ගොවිතැන් කටයුතු කරන ජයසේන මහතා කුඹුරු අක්කර තුනක් අඳයට වැඩ කරනව.

ජයසේන මහතා කලින් තරුණ ගොවි සමාජයේ සභාපති හැටියට වැඩ කරල ඒ ගොවි සමාජයට තල්පෙ පත්තුවේ තරුණ ගොවි සමාජ අතරින් පළමුවෙනි තැන ලබා දුන් බව ඔහු පැවසුව. ඔහු දැන් ගොවි කාරක සභාවෙත්, විවිධ සේවා සමුපකාර සමිතියෙත් නිල තල දරනව. ජයසේන මහතා ඉස්සර වෙලාම කිවුවෙ ගොවිතැන් කටයුතු කරන්න තමන්ට ලැබෙන ණය මුදල මදි බවයි. ඒ වගේම, ඒ මුදල ලබා ගන්නත් හුඟක් කරදර වලට මුහුණ දෙන්න වෙනව. ගොවි කාරක සභාවත්, ග්‍රාම සේවක මහත්තයත් ණය ඉල්ලුම් පත්‍රය සහතික කළාට පස්සෙ උප දිසාපති තුමාගෙන් අනුමැතිය ලබා ගන්න වුන බව ජයසේන මහතා කියා සිටිය. ඔහු ණය ගන්නේ කොග්ගල විවිධ සේවා සමුප කාර සමිතියෙනුයි. ඔහුගේ පසුගිය කන්නය වැස්සෙන් පාලු වුන හින්ද කලින් ණය ගෙවන්න ඔහුට බැරි වුනා. මේ වතාවේදී රු. 800/- ක් ණය ඉල්ලුවට ලැබුණේ රු. 420/- යි.

මේ ණය මුදලත් එක පාරටම තමන්ට ලැබෙන්නෙ නැහැ. සමහර වෙලාවට ඒව ලැබෙන්නෙ මුදලින් නෙවෙයි, ද්‍රව්‍ය වලින්. සමුපකාරයෙන් ද්‍රව්‍යවලින් දෙන ණය හැටියට පෝර බිලක් ලිව්වම ඒ බිලේ පෝර ජාති දෙකක් තුනක් තිබුනත් හුඟක් වෙලාවට ලැබෙන්නේ එක වර්ගයයි. උවමනා වෙලාවට උවමනා තරම් පෝර ලැබෙන්නෙත් නැහැ. ඖම් වගේ දේවල් හින්ද අස්වැන්න වැඩි කර ගන්න බැරි වන බව ජයසේන මහතා කිව. මෙයින් වෙන්නෙ ලැබෙන අස්වැන්න අඩු හින්ද ණය ආපහු ගෙවන්න පුළුවන් කමක් නැති වීමයි.

ගොවිතැන් කටයුතුවලට දෙන හදිසි ණය මුදල තමන්ට තවම ලැබුනෙ නැති බව ඔහු කියා සිටිය. එය ලැබුන නම් තරමක් දුරට තමන්ගේ ගොවිතැන් කටයුතු වලට සහනයක් සිදුවන්න තිබුන බව ජයසේන මහතාගේ අදහසයි.



ඕනකරන වෙලාවට ඕන කරන දේවල් ලැබෙන්නෙ නැත්නම් ගොවිතැන වුනත් හරියට කරන්න බැරි බව ජයසේන මහතා කියයි.

ජයසේන මහතා කියන්නේ කන්න පාලු වෙන විටදි ටිකක් හරි සහනයක් ලබා ගන්න නම් කුඹුරු රක්ෂණය කරන්න ඕනෑ කියලයි.

වී වලට අමතරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මධ්‍යස්ථානයකින් බීජ ලබාගෙන බඩ ඉරිඟු, මුංඇට ආදියත් ඔහු හිටවල තියෙනව.

ජයසේන මහතා කිව්වේ ඒ පළාත්වලට වාරිමාර්ග පහසුකම් නැති බවයි. කුඹුරු වැඩ කරන්න ඔහු වතුර ගන්නෙ පිලාන ඇලෙන්. එය මීගොඩ සිට එන හැතැප්ම 1 3/4 ක් විතර දිග ඇලක්.

මේ ඇල දෙපැත්තෙ දැන් වල් පැලෑටි වැවිල වතුර බැහැගෙන යන්නෙ නැති තත්වයකට ඇවිත්. මෙය සුද්ද කරන්න ගොවි කාරක සභාවට කියා හිටිය. ඒ වුනත් ගොවි කාරක සභාව එය කළේ නැහැ. 1965 න් පස්සෙ මේ ඇල පිරිසිදු කර නැහැ. වාරිමාර්ග අංශයට මේ ගැන කරුණු කියපුවාම ඒ අය කියා සිටියේ වරකබොක්ක ව්‍යාපාරයේ වැඩ ඉවර නොකර මේ කුඩා ඇල මාර්ගවල වැඩ කරන්නෙ නැති බවයි. ඒත් ජයසේන මහතා කියන විදියට වරක බොක්ක ව්‍යාපාරය තවම පටන් අරගෙන වත් නැහැ. ගොවි කාරක සභාව මේ වැඩය කරන්න ලැහැස්තියි. ඒ වුනත් එහි මුදල් මෙයට වියදම් කිරීම ගැන ප්‍රශ්නයක් තියෙන හින්ද ඒ අය දැන් මේ ගැන වැඩි උනන්දුවක් නැහැ.

ගොවි කාරක සභාවට ඉහින යන්ත්‍ර තියෙනව. ඒ වගේම රෝද දෙකේ ට්‍රැක්ටර් ද තියෙනව. ට්‍රැක්ටරය කුලියට ගත්තහම අක්කරයකට රු. 50/- ක් විතර අය කරනව. ඇති තරම් මේ උපකරණ නැති හින්ද ගොවින් හැම දෙනාම එකට කන්නයේ වැඩ කරන කොට මේ බඩු බාහිරාදිය ලබා ගන්න ටිකක් කරදරයි. ආණ්ඩුවේ ට්‍රැක්ටර් මධ්‍යස්ථානයක් ඒ පළාතේ තියෙනව. ගොවිතැන් කටයුතු වලට එය ලොකු උදව්වක්.

ජයසේන මහතා ගොවිතැන් කරන්නේ අද ඊයේ පටන් ගත්ත උනන්දුවක් හින්ද නොවන බව ඔහු කිව්ව. ඒ වුනත් ගොවිතැන් කටයුතු නොකරපු අයත් දැන් දැන් ඒ ප්‍රදේශයේ මයියොක්කා ආදිය හිටවල තියෙනව. ජයසේන මහතා අවසාන වශයෙන් කියා සිටියේ ඒ පළාතේ ද ඉඩම් නැතිකම ගොවිතැන් කටයුතු වලට ලොකු කරදරයක් බවයි.

× × ×

**බද්දේගම, අම්පෙගම, ''සරසවියේ'' අයි. එම්. කේ. හෙට්ටිආරච්චි** මහත්මිය විශ්‍රාම ලබාපු මුල් ගුරු මහත්මියක්. ඇයගේ වයස අවුරුදු 59 යි. ගොඩ ඉඩම් අක්කර 1 1/2 කුත් මඩ ඉඩම් අක්කර 2 කුත් දැන් හෙට්ටිආරච්චි මහත්මිය ගොවිතැන් කරනව. 1971 ජනවාරි මාසයේ විශ්‍රාම ලැබුවට පස්සෙ වඩාත් හොඳින් ගොවිතැන් කටයුතු කරන්න

ඉඩ කඩ ලැබුන බව හෙට්ටිආරච්චි මහත්මිය කියා සිටිය. ඇය කියන විදියට ගොවිතැන් කටයුතු කරන්න පටන් ගත්තෙ හදිසියෙන් රට පුරා ඇති වුන උනන්දුව හින්දම නෙවෙයි. මුල ඉඳන්ම ගොවිතැන් කටයුතු වලට ඇය හුඟක් කැමතියි. ඇයගේ පියා ගොවියෙක්. ඒ නිසා ඉස්කෝලෙ උගන්වන කාලයේ දී වුවත් ළමයිනුත් එක්ක ඉස්කෝලෙ වත්තෙ නොයෙකුත් බෝග ජාති වවන්න හෙට්ටි-ආරච්චි මහත්මිය ළමයින්ට උදව් වුන බව කිවුව. නොයෙක් වේලාවලදී විශ්ව විද්‍යාලයේ ඉගෙන ගත්ත දුව එක්කත් කුඹුරට බැස ගොවිතැන් කටයුතුවල යෙදුන බව ඇය පැවසුව.

ඒ පළාතේ පවතින හාල් හිඟය දුප්පත් අයට ලොකු කරදරයක් හින්ද තමාගේ ගෙවත්තෙ මයියොක්කා, බතල, හිඟුරල, කුකුළල වාගෙ අල ජාති වවන්න හෙට්ටි-ආරච්චි මහත්මිය උනන්දුවක් දක්වා තියෙනව. මේ අල ජාති හුඟක් අවස්ථාවල දී ගමේ



ගුරු ජීවිතයකින් විශ්‍රාම ලබා ගොවි ජීවිතයක් ආර මහ කළ හෙට්ටිආරච්චි මහත්මිය.

දුප්පත් අය ඇවිල්ල ඇයගෙන් ඉල්ලාගන යන බව ඇය කියා සිටිය. කහ වලින් හෙට්ටි ආරච්චි මහත්මිය හොඳ ආදායමක් ලබනව.

පළාතේ ගොවි කාරක සභාවේ සභා පතිනිය හැටියට වැඩ කරන බවත් 1972 මාර්තු මාසයේ දිම්බුර-වැලිවිටිය කොට්ඨාශ-යේ මිරිස් වගා තරඟයෙන් දෙවැනි තැන ලැබූ බවත් ඇය ප්‍රකාශ කළා.

ගොවි කාරක සභාවේ සභාපතිනිය වුනත් ගොවි කාරක සභාව ගොවිතැන් කටයුතුවලට දක්වන සැළකිල්ල මදි බව ඇය කීව. ගොවි කාරක සභාව අය කරන බදු ගාස්තු ගෙවා ගන්නවත් පුළුවන් ආදායමක් ඒ පළාතේ දුප්පත් අයට නැහැ. ඒ හින්ද ගොවි කාරක සභාවට සැහෙන ආදායමක ලැබෙන්නෙත් නැහැ. සල්ලි නැතිකම හින්ද බෙහෙත් ඉහින යන්ත්‍රයක් ලබා ගන්න ගොවි කාරක සභාවට බැරි උනා. සැරෙන් සැරේ ටික ටික සල්ලි ගෙවන්නවත් යන්ත්‍රයක් ලබා ගන්න ඇය යෝජනා කළත් මිළ මුදල් හිඟකම නිසාම එය කර ගන්න ගොවි කාරක සභාවට පුළුවන් වුනේ නැති බව හෙට්ටි-ආරච්චි මහත්මිය ප්‍රකාශ කළා. මිළ මුදල් අතින් ශක්තියක් තියෙනව නම් මේ කාරක සභාවට ඒ පළාතේ දුප්පත් ගොවි මහතුන් වෙනුවෙන් ලොකු සේවයක් කරන්න පුළුවන්. පොදු වැඩ කර ගන්න කාරක සභාවේ සාමාජිකයන් එක්කාසු කර ගැනීමත් අමාරුයි. ඒ වුනත් ගොවි කාරක සභාව එක හොඳ වැඩක් කළා. ඒක තමයි, අම්පෙගම වෙල්යා-යේ - ඇල ඒ කියන්නේ, දිවිතුර ඇලෙන් කොටසක් ශ්‍රම දානයක් මගින් සුද්ද කිරීම.

බෙහෙත් ඉහින යන්ත්‍ර හිඟකම හින්ද මුළු යායටම බෙහෙත් තෙල් ඉහින්නේ එක්කෝ එක්කෙනයි නැත්නම් දෙනන්යි. මෙහෙම වුනහම අනෙක් කුඹුරුවල ඉන්න මැස්සො තෙල් ඉහපු කුඹුරු වලට බෝ වෙනව. අඩු ගණනේ මේ යන්ත්‍ර දෙක තුනක් වත් ගොවි කාරක සභාවට තියෙනව නම් මේ ප්‍රශ්නය විසඳගන්න පුළුවන්.

හෙට්ටිආරච්චි මහත්මිය පවසන විදියට මේ කන්නයේ දී බීජ වී ලබා ගන්න ගොවි

මහතුන්ට ටිකක් කරදර වලට මුහුණ දෙන්න සිදු වුනා. බීජ වී බුසලක් රු. 30 යි. ආණ්ඩු වෙන් වී ගන්නේ රු. 25 ටයි. ඒ ගමේ සමහර ගොවි මහත්වරු බීජ වී ඕනෑ කරන වෙලාවේදී සල්ලි වෙනුවට වී දෙන්න සූදානම් වුනා. ඒ වුනත් කෘෂිකර්ම මධ්‍යස්ථානය ඒ වී ගත්තෙ නැහැ. ඒ අය සල්ලිම ඉල්ලලා තිබ්බ. ගොවි මහත්වරුන්ගේ අතේ නිතරම ඕනෑතරම් සල්ලි නැති හින්ද බීජ වී ලබා ගන්න ඕන වෙලාවලදී ඒ වෙනුවට සල්ලි නොදී වී දෙන කොට එය බාර ගන්න වැඩ පිළිවෙලක් සකස් කළොත් එය හුඟක් හොඳයි.

සමුපකාරය ගැන කතා කරමින් හෙට්ටිආරච්චි මහත්මිය කීවේ සමුපකාරයෙන් ඕන වෙලාවට ඕන කරන පොර ලැබෙන්නෙ නැති බවයි. ගොවි මහතුන් කරදර වලට මුහුණ දෙන තවත් එක් අවස්ථාවක් ගැන ඇය කතා කළා. සමුපකාරයෙන් දෙන පොර මලුවල තියෙන්නෙ මොන පොරද කියල කොහේවත් ලියල නැති හින්ද සමුපකාරයේ කළමනාකාර මහතා කියන දේ පිළිගන්න ගොවි මහත්වරුන්ට සිද්ද වෙනව. කලින් ටීඩීඑම් අංක 2, ටීඩීඑම් අංක 3 කියල පොර මලු වල පොර ජාතියෙ නම ලියල තිබුන. දැන් එහෙම නැහැ. සමහර විට කළමනාකාර මහතා පොර ජාතිය ගැන නොදන්නවා වෙන්නත් පුළුවනි. මේ සැරේ ගොවි කාරක සභාවෙන් පොර දෙවර්ගයක් ඉල්ලුවා. ඒ දෙවර්ගය ටීඩීඑම් 2 සහ 3. නමුත් ලැබුනේ නම සඳහන් නොකරපු වර්ගයකුයි, යූරියා පොරයි. හෙට්ටිආරච්චි මහත්මිය කියන්නේ මේ ප්‍රශ්නය ඉතාමත් ලේසියෙන් විසඳ ගන්න පුළුවන් පොඩි ප්‍රශ්නයක් බවයි. පොර මලුවල නම යෙදීම එතරම් අමාරු කාරියක් යයි ඇය විශ්වාස කරන්නෙ නැහැ.

සමුපකාරයෙන් ණය ලබා ගන්න ගොවි මහත්වරුන්ට ටිකක් කරදරයි. සමුපකාරයේ සාමාජිකයෝ දෙන්නෙක් ඒ ඉල්ලුම් පත්‍රයට අත්සන් කරන්න ඕන. ඒ සාමාජිකයෝ ණය අරගෙන තියෙනව නම් ඒ අයටත් අත්සන් කරන්න බැහැ. ඒක හින්ද වැඩි කරදරයක් නැතිව ගොවි මහත්වරුන්ට ණය ලබා ගන්න පිළිවෙලක් යොදනව නම් එය වැදගත්. ඒ පළාතෙ අයට ඕන තරම් උදලු සමුපකාරයට ලැබෙන්නෙ නැතැයි හෙට්ටිආරච්චි මහත්මිය වැඩිදුරටත් කියා සිටිය.

අම්පෙගම අයිති වෙන්නෙ බද්දෙගම රන්ගිරියේ කෘෂිකර්ම කාර්යාලයටයි. එය තියෙන්නෙ ටිකක් දුර බැහැර තැනක හින්ද බීජ පැල ආදිය ලබා ගන්න එතැනට යාම ටිකක් කරදරයි.

ගොවිතැන් කිරීමෙන් ලොකු සතුටක් ලැබෙන බව පැවසූ හෙට්ටිආරච්චි මහත්මිය තමන් සාර්තක ගොවි මාතාවක් හැටියට හඳුන්වල දුන්න.

ඇය පවසන විදියට කුඹුරු අක්කරයක් වගා කරන්න රු. 400 ක් විතර වියදම් වෙනව. ඒ උනත් ඒ පළාතේ පසේ හැටියට ලැබෙන අස්වැන්න සාමාන්‍යයෙන් අක්කරයකට වී බුසල් 25 ක් නැත්නම් 30 ක් විතර. ඇය කියා සිටියා ඒ පළාතේ කුඹුරු වල පස පිළිබඳව සොයා බලා ඒ ගැන කටයුතු කළොත් මීට වඩා අස්වැන්නක් ලබා ගන්න පුළුවන් වෙන බව.

ගමේ ඉන්න හැම කෙනෙක් ගැනම හොඳින් දන්නා බව පැවසූ හෙට්ටිආරච්චි මහත්මිය ඒ ගමේ තත්වය අනුව නම් හාල් සලාකය අඩු කිරීම ටිකක් බරපතල ප්‍රශ්නයක් බව කීව. ඒ පළාතේ හුඟක් අයට ඉඩම් නැහැ. ඒ හින්ද කිසි දෙයක් වවා ගන්නටවත් පුළුවන් කමක් නැහැ. ඇය කියන හැටියට ඉස්සර වගේ නෙවෙයි, දැන් ඇයගෙන්ම බතල දඬු, මයියොක්කා දඬු ආදිය ලබා ගන්න අයගේ ගණන හුඟක් වැඩියි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇයගෙන් මේව ඉල්ලපුවහම දුන්නෙ නැත්තෙ ගමේ දුප්පත් අයට බෙද දෙන්න ඕනෑ හින්දයි. ඇය කියන්නේ කවුරු කවුරුත් මොන මොනව හරි වැවුවහම අනුන්ගේ දේවල් ආදිය හොරකම් කරන්න කවුරුවත් එන්නෙ නැති බවයි. ඒ පළාත ගැන කල්පනා කරන කොට නම් තවත් හාල් සේරු බාගයක් දෙන්න තීරණය කිරීම වටිනා දෙයක් බව අවසාන වශයෙන් හෙට්ටිආරච්චි මහත්මිය කියා සිටියා.

x x x

**මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටියේ, ඉස්කෝලෙහේනේ පී. ඒ. පේමදස, මහතා**

ගේ වයස අවුරුදු 35 යි. ඔහු දරුවන් දෙන්නෙකුගේ පියෙක්. පේමදාස මහතා අවුරුදු 10 ක විතර හිටන් ගොවිතැන් කර ගෙන යන කෙනෙක්. ඔහු වපුරල තියෙන්නෙ බී. ජී. 34/6 කියන වී වර්ගයයි. මේ වී වර්ගය කන්න තුනටම වගා කරන්න පුළුවන්. ඔහු කුඹුරු අක්කර 3 ක් විතර වැඩ කරනව. පේමදාස මහතා කියන හැටියට අක්කරයක් වැඩ කරන්න රු. 700 ක් විතර වියදම් වෙනව. එහෙම කියන්නෙ දැන් කුලිය කාරිය වැඩි හින්දයි. ඔහු පෞද්ගලික අය-ගෙන් අත් ට්‍රැක්ටර් කුලියට ගන්නව. කඹුරුපිටියේ විවිධ සේවා සමුපකාර සමිතියට තියෙන්නෙ ලොකු ට්‍රැක්ටරයක් විතරයි. පළාතේ ගොවි කාරක සභාවට හොණ්ඩා වර්ගයේ පොඩි ට්‍රැක්ටරයක් තියෙනව. ඒත් ඒක කැඩිල. කොටස් නැති හින්ද අලුත්වැඩියා කරල නැහැ. ගොවි කාරක සභාවත් ගොවි යෝත් කැමති නැහැ, මේ අත් ට්‍රැක්ටරය අලුත්වැඩියා කරන්න මුදලක් වියදම් කරන්න. අක්කර 250 ක් විතර යායකට බෙහෙත් තෙල් ඉහින්න ගොවි කාරක සභාවට තියෙන්නෙ එකම එක යන්ත්‍රයයි. ඒක තමන්ට ඕනෑ කරන වෙලාවට ලබා ගන්න බැහැ.

උවමනා පෝර උවමනා වේලාවට ලැබෙන්නෙ නැති බවත් පෝර බෙදීමද හොඳින් නොකෙරෙන බවත් පේමදාස මහතා කියා සිටියා. ඒ වගේම සමුපකාරයෙන් ණය ගන්නත් අමාරුයි. ඒ පළාතේ හදිසි ණය දුන්නේ, පේමදාස මහතා කියන විදියට කුඹුරු පාලුවුන අයට විතරයි. ගොවි කාරක සභාව අනුමත නො-කරපු අනෙක් අයට ණය ලැබුනේ නැහැ. කුඹුරු හාන්න, එහෙම නැත්නම් ගොයම් කපන්න ඕන කරන කොට නියම වෙලාවට ණය ලැබෙන්නෙ නැහැ. හුඟක් වෙලාවට මේ කටයුතු අහවර වුනාට පස්සෙ සල්ලි හම්බ වෙනව. එතකොට වෙන්නෙ ගොවි මහත්වරු ඒ සල්ලි වෙන වෙන දේවල් වලට වියදම් කරන එකයි.

තමන්ගෙ කුඹුරුවලට වතුර ගන්න විදිය ගැන කතා කළ පේමදාස මහතා කියා සිටියේ හපුගොඩ අමුණේ සිට කඹුරුපිටියේ වලවෙල යායට වතුර ගන්න ඇල දැන් තැනින් තැන ගොඩ වෙලා වතුර බැහැගන යන්නෙ නැති තත්වයක තියන බවයි. වතුර ඕන කරන වෙලාවට, ගොවි කාරක සභාවෙන් ඇල තාවකාලිකව පිරිසිදු කරල ඒ වෙලාවට විතරක් වතුර ටිකක් ලබා ගන්නව. ඒ වුනත් ඒක ප්‍රශ්නයට හොඳ උත්තරයක් නෙවෙයි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඉක්මණින් කරන්න ඕනෑ වැඩ ඇතුලත් ලැයිස්තුවක මේ ඇලත් තියනව. ඒ වුනත් තවම ඇල පිරිසිදු කිරීමට කවුරුවත් කටයුතු කරල නැහැ.



**පේමදාස මහතා කියන්නේ මේ ඇල ගැන ගොවි කාරක සභාවට කොච්චර කිව්වත් තවම වැඩක් වුනේ නැති බවයි.**

ඒ ප්‍රදේශයේත් ඉඩම් ප්‍රශ්නය තදින්ම පෙනෙන්න තියෙනව. ඉඩම් තියෙනවනම් දැන් තියෙන උනන්දුවෙ හැටියට ගොවිතැන් කටයුතු වලින් හොඳ ප්‍රතිපල ලබන්න පුළුවන් බව පේමදාස මහතාගේ අදහසයි.

× × ×

**විල්පිට, හේනෙගෙදර, යහමුල්ල, ඉහළ අකුරලියේ, එම්. වයි. චාර්ලිස්** මහතා වයස අවුරුදු 51 ක ගොවි මහතෙක්. ඔහු දරුවන් 4 දෙනෙකුගේ පියෙක්. ප්‍රවේනි උරුමෙන් තමන්ට අයිති වෙච්ච මඩ ඉඩම් අක්කර 1 1/2 කුත් අදයට අක්කර 1 3/4 කුත්

ගොඩ ඉඩම් අක්කර 1 1/2 කුත් චාර්ලිස් මහතා වැඩ කරනව. චාර්ලිස් මහතා කීවෙ ඒ පළාතේ මඩ ඉඩම් අක්කරයක් වවන්න සාමාන්‍යයෙන් රු. 450 ක් විතර වියදම් වෙන බවයි. අක්කරයකට අස්වැන්න පාළොස් 25 ක් (පාළොස් 1 – බුසල් 2) විතර ලැබෙන බව චාර්ලිස් මහතා කියා සිටිය.

චාර්ලිස් මහත්මයා ණය ගන්නේ යහ-මුල්ල විවිධ සේවා සමුපකාර සමිති ප්‍රාදේශික-යෙන්. ඔහු කලින් ගත්ත ණය මුදල්වලින් රු. 300 ක් විතර තවම ගෙවන්න තියෙනව. එක අවුරුද්දකට එක සැරයක් ණය අරගෙන කන්න දෙකට ඒ ණය ගෙවා ඉවර කරන බව චාර්ලිස් මහතා කියා සිටියා.

චාර්ලිස් මහතා තදින්ම කියා හිටියේ ඕන කරන වෙලාවල්වලට ඕන කරන පෝර ලැබෙන්නෙ නැති බවයි. ආණ්ඩු වෙන් අනුමත කරල තියෙන වී වර්ග වවන හින්ද ඒවාට ඕන කරන පෝර ඕන කරන වෙලාවට ලැබුනෙ නැත්නම් අස්වැන්න අතින් පාඩු විඳින්න සිදුවන බව ඔහු කීව. වල් පැලෑටි වඳ කරන බෙහෙත් වර්ග නොයෙක් ජාති තිබුනත් චාර්ලිස් මහතා කියන්නෝ 'සර්කෝපර්' තෙලට හැර වෙනත් තෙල් වලට ඇටොර (වල් පැලෑටියක්) මරන්න බැරි බවයි.

ගොවි කාරක සභා ගැන චාර්ලිස් මහතා කිවේ ඒ කාරක සභාව කිසිම වැඩකට උනන්දු වෙන්නෙ නැති බවයි. කඳු අතරින් ගලාගෙන එන දිය පාරක් පෙන්වල ඔහු කිවුව ඒ දිය පාරින් පොඩි කුඹුරු යායකට වතුර ගන්න ඕන කරපු කුඹුස්සක් (හියුම් පයිප්පයක් ?) ලබා දෙන්න ගොවි කාරක සභාවට කොච්චර කිව්වත් වැඩක් උනෝ නැති බව. ගොවි කාරක සභාව මේ වගේ පොඩි දේකටවත් උදව්වක් දෙන්නෙ නැති හින්ද අක්කර බදු ගෙවන්නත් ගොවියෝ එච්චර උනන්දුවක් දක්වන්නෙ නැහැ. ගොවි හැඳුනුම් පත් ලබාගන්න සල්ලි ගෙවලත් දැන් අවුරුද්දක් විතර වෙනව. ඒත් තවම ගොවි හැඳුනුම් පත් චාර්ලිස් මහත්මයට ලැබිල නැහැ.

තමන්ගේ වී විකුණන්න කරදරයක් නැති බව චාර්ලිස් මහතා කියා හිටිය. ඔහු කීවේ පසුගිය කන්නයේ වී බුසල් 80 ක් විතර වික්ක බවයි. චාර්ලිස් මහතාගේ වචන වලින් කිව්වොත් හාල් සලාකය ගැන ඔහු කීවෙ "ඔය සේරු බාගෙ නැතිවට ජීවත් වෙන්න පුළුවන්'' බවයි. චාර්ලිස් මහතා කියන හැටියට ටික කලකට හාල් පොත නතර කළත් ඔහුගේ අසතුටක් නැහැ. ඒ වුනත් හාල් සලාකය ලොකු සහනයක් හැටියට සලකන දුප්පත් අයත් ඒ පළාතේ ඉන්නව.

හාල් සලාකය අඩු කිරීම හින්ද ගොවි තැන් කටයුතු ගැන විශේෂයෙන් තරුණ අය අතරේ උනන්දුවක් තියෙන බව චාර්ලිස් මහතා කීව. ආණ්ඩුව වී මිළ වැඩි කරන කොට වැඩි අස්වැන්නක් ගන්න හුඟක් උත්සාහ කරනව. පෝර, තෙල් වර්ග ආදිය නම් ටිකක් ගණන් වැඩියි. ඒ හින්ද සමහර විට ලැබෙන ලාබය ඒවට කැපිල යනව. චාර්ලිස් මහතා අවසාන වශයෙන් කියා සිටියෙ මැරෙන තුරු ගොවිතැන අත හරින්නේ නැති බවයි. ඒ වගේම ළමයින්ටත් එය පුරුදු කිරීමට ඔහු අදහස් කරනව.



චාර්ලිස් මහතාගේ කුඹුර අද්දර ඕව්වේ ලස්සනට මැකරල් වවා තියෙනවා.

චාර්ලිස් මහතාගේ ගොඩ ඉඩම් වල කුරුඳු, පොල්, කෙසෙල්, තුන් මස් අල, මයියොක්කා ආදියත් වවාගෙන තිබුන අතර

ඔහුගේ කුඹුරේ ඕවිට දිගටම සරුවට මැකරලුත්, ඉන්නලත් වවල තිබුන.

× × ×

**නාවිමන, මාලගොඩ, කුරුප්පුගේ ජුලියන් අප්පුහාමි** මහතාගේ වයස අවුරුදු 78 යි. ඔහු කුඹුරු අක්කර 2 ක් අඳයට වැඩ කරනව. ඔහුට ගොඩ ඉඩම් නම් එච්චර නැහැ. පදිංචිව ඉන්නෙත් බද්දට ගත්ත ඉඩමක තියෙන පොඩි ගෙයකයි. ආණ්ඩුවෙන් අක්කර කාලක් ගොඩ ඉඩම් ජුලියන් අප්පුහාමි මහතාට ලැබිල තියෙනව.

කුඹුරු අක්කරයක් වැඩ කරන්න රු. 400 ක් විතර වියදම් වෙන බව ජුලියන් අප්පුහාමි මහතා කිවුව. ඔහු කියන හැටියට මේ දවස් වල කුලී ගාස්තු හරියට වැඩියි. ඒ හින්ද කුඹුරු වපුරන කොට ඉස්සරට වැඩියෙන් වියදම් කරන්න සිද්ද වෙනව.

ජුලියන් අප්පුහාමි මහතා පෝර අරගන්නේ මාලගොඩ සමුපකාරයෙන්. පෝර ඕන කරන වෙලාවට ලැබෙන්නෙ නැහැ. ඒ වගේම ඔහු කියන හැටියට ණය ගැනීමත් තමන්ට ඕන කරන වෙලාවට කර ගන්න අමාරුයි.

ජුලියන් අප්පුහාමි මහතා කිව්වේ ගොවි කාරක සභාවෙන් තමන්ට වැඩි ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැති බවයි. ඒ ගොවි කාරක සභාවට බෙහෙත් ඉහින පොම්පයක් තියෙනව. ඒත් ඒක දැන් කැඩිල. අත් ට්‍රැක්ටරයකුත් තියෙනව. ඒ වුනත් ඒකෙ වැඩ කරන්න කෙනෙක් නැති හින්ද අත් ට්‍රැක්ටරය කවුරුවත් පාවිච්චි කරන්නෙ නැහැ. ජුලියන් අප්පුහාමි මහතාට වතුර අතින් නම් කරදරයක් නැහැ. ඔහු වපුරල තියෙන්නෙ බී. ජී. 11. බිජ වී තමන්ම හද ගන්නව. ඔහුගෙ ගොවිතැන් වැඩ වලට පවුලේ අනෙක් අයත් උදව් කරනව.

ඔහු අවසාන වශයෙන් කියා සිටියේ ගොවිතැන වුනත් දැන් පරණ ක්‍රමයට කිරි මෙන් හොඳ අස්වැන්නක් ලබා ගන්න බැහැයි කියලයි. ඒ හින්ද ඔහු ගොවිකම් උපදේශක මහත්වරුන්ගේ උපදෙස් අරගෙන අළුත් ක්‍රම හැම එකක්ම ඒ විදියට අනුගමනය කරනව. ඔහුගේ කුඹුරේ නියරවලත් මුංඇට, බන්ඩක්ක, ඉන්නල ආදිය වවල තියෙනව.

× × ×

**කැකනදුර උතුර, තලල්ලේ, ඒ. ද. එස්. ජයසිංහ** මහතා මඩ ඉඩම් අක්කර 4 කුත් ගොඩ ඉඩම් අක්කර 3 කුත් අයිති ගොවි මහතෙක්. ඔහු ගොවිතැනට අමතරව වෙළඳාමත් කරනව. ගොවි තැන් කිරීමට ජයසිංහ මහතා ණය අරගෙන නැහැ. ඔහු කියන හැටියට බීජ වී ලබා ගැනීමට නම් කරදරයක් නැහැ. ඒත් සමුපකාර වලින් පෝර ලබා ගැනීම නම් බරපතල ප්‍රශ්නයක්.

කෘමි නාශක ද්‍රව්‍ය ගැන කතා කරමින් ජයසිංහ මහතා කිවුවෙ තමන්ට හුරු කෘමි නාශක ද්‍රව්‍ය ලබා ගැනීමට බැරි වුන එක් අවස්ථාවක ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කෘමි නාශක බෙහෙත් යෙදූ බවයි. එයින් වල් පැළ නොමැරුන හින්ද මාරුක් (වල් පැලැටි) අතින් ගැලවීමට සිදු වූ බව ජයසිංහ මහතා කියා සිටිය.

ගොවි කාරක සභාව ගැන ජයසිංහ මහතාගේ එතරම් පැහැදීමක් නැහැ. අත් ට්‍රැක්ටර් ආදියත් ඔහු කුලියට ගන්නේ පුද්ගලික අයගෙන්. ගොවි කාරක සභාවට බෙහෙත් ඉසින යන්ත්‍රයක් නැහැ. තමන්ගේ යායට ඕනෑ කරන කුඹස් ලබා දෙන්න කියල ජයසිංහ මහතා කීප වරක් පරවාහැර ගොවි කාරක සභාවේ ලේකම්ට ලිවූ බව කියා සිටිය. ඔහු කියන හැටියට ඒ ගැන තවම කිසිම සතුටුදායක තත්වයක් පේන්න නැහැ.

ඇල්ල කන්ද වැවෙන් වතුර ලැබෙන හින්ද ජයසිංහ මහතාට වතුරෙන් කරදරයක් නැහැ.

ඔහු 1971 දී පේරාදෙණියේදී ගොවිකම් කටයුතු ගැන ඉගෙන ගෙන තියනව.

ජයසිංහ මහතා අවසාන වශයෙන් කියා සිටියේ ඒ පළාතේ හැම කෙනෙක් අතරම ගොවිතැන ගැන කවදවත් නැතිතරම් ලොකු උනන්දුවක් දැන් තියෙන බවයි.

× × ×

**රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල, මස්ඉඹුල, එම්. වී. ලොකුමහත්මයා** මහතා

මුලහිටම ටිකක් සරුවට ගොවිතැන් බත් කරගෙන යමක් කමක් හරි හම්බ කරගත්ත ගොවි මහතෙක්. ඔහුගේ වයස අවුරුදු 57 යි. ඔහු දරුවන් 7 දෙනෙකුගේ පියෙක්. ලොකු මහත්මයා මහතා පරවේණි උරුමයෙන් ලබාපු මඩ ඉඩම් අක්කර 5 කුත් නින්දගම් යටතේ තවත් අක්කර 7 කුත් ගොවිතැන් කරනව. ඔහු පේරාදෙණියේ දී ගොවිතැන් කටයුතු ගැන සුමනායක පුහුණුවක් ලැබූ බව කියා සිටියා. කලින් ගොවි කාරක සභාවේ සභාපති හැටියටත් ලොකුමහත්මයා මහතා වැඩ කර තියෙනව. කොහොම වුනත් ගොවි කාරක සභාව ගැන කතා කරමින් ඔහු කීවේ මේ වෙලාවේ හැටියට නම් ඒ ගොවි කාරක සභාවෙන් ගොවිතැන් කටයුතු වලට මොනම උදව්වක් වත් ලැබෙන්නෙ නැති බවයි.

ලොකුමහත්මයා මහතා දේශපාලන අදිකාරය ගැනත් කතා කළා. ඔහු කිව්වෙ දේශපාලන අදිකාරය හින්ද පළාතේ දියුණු-වට කෙරෙන වැඩ කටයුතු ගැන අමුතු උනන්දුවක් දැන් තියෙන බවයි. කලින් වාගෙ නොවෙයි, දැන් දැන් ආණ්ඩුවේ නිලධාරි මහත්වරු වඩ වඩාත් ගොවි මහතුන් හමු වෙන්න එන බවත් ගොවි මහතුන්ට තමන් ගේ වග කීම ගැන වෙනදට වඩා හොඳ දැනුමක් දැන් තියෙන බවත් ලොකුමහත්තයා මහතා කියා සිටිය.



ඒ කාලෙ නම් ගොවිතැන ගැන මේ තරම් උනන්දු වක් තිබුනෙ නැතැයි කියන ලොකුමහත්මයා මහතා

ඔහු ටිකක් අතමිට සරු කෙනෙක් හින්ද අත් ට්‍රැක්ටර් දෙකක් සල්ලි වලට ගන්න ඔහුට පුළුවන් වුනා. ඔහු කියන විදියට කුඹුරු හාල ඉවර වුනාට පස්සෙ මේ අත් ට්‍රැක්ටර් දෙක අනෙක් අයට කුලියට දෙනව. ඒ වුනත්, ට්‍රැක්ටර් අයිති සමහර අය වගේ ලොකු කුලියක් තමා අය නොකරන බව ඔහු කියා සිටියා. සමුපකාරය ගැන ලොකුමහත්මයා මහතා ටිකක් පැහැදිලා ඉන්න කෙනෙක්. සමුපකාරයේ ණය කටයුතු නම් තවම හොඳට පෙළ ගැහී නැති බව ඔහු කීව. පෝර ආදිය ලබා ගැනීමේදී ඒ පළාතේ ගොවි මහත්වරු එතරම් කරදරයකට මුහුණ නොදෙන බවයි ඔහු කියා සිටියේ. ලොකුමහත්මයා මහතා කියන්නේ, කල් වේලා ඇතුව තම තමන්ට ඕන කරන දේවල් සමුපකාරයට දන්වල තිබුනාම පෝර ආදිය ලබා ගන්න වැඩි කරදරයක් ඇති වෙන්නෙ නැති බවයි. කලට වෙලාවට ඒවා නොඉල්ලන එක අපේම දුර්වල කමක් නේද කියා ඔහු ප්‍රශ්න කළා. ඒ සමුපකාරයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පළාතේ කෘෂිකර්ම උපදේශක මහතා ද ඇතුළත් කරන්න පුළුවන් වෙලා තියෙන හින්ද ගොවි මහත්වරුන්ට ඕන කරන දේවල් ඒ මහතා නියම වෙලාවට සමුපකාරයේ අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වනව. එතකොට ඒ දේවල් සපයා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරන කොට සමුපකාර වැඩ කටයුතු හොඳින් කෙරෙන බව ලොකු මහත්මයා මහතා කියා සිටිය.

දැන් කාලෙ කුලී ගාස්තු කාරිය වැඩි හින්ද කුඹුරු අක්කරයක් වගා කරන්නට රු. 500 ක් විතර වියදම් වෙන බවයි ඔහු කියා සිටියෙ. අස්වැන්න හොඳ වුනොත් බුසල් 70 ක් විතර ලබාගන්න පුළුවන්. වැඩි අස්වැන්නක් ලබා ගන්න පැල හිටවන එක ඒ පළාතේ කරන්නේ නැහැ. එහෙම නො කරන්නේ ලියදි හුහක්ම පොඩි හින්දයි.


ලොකුමහත්මයා මහතා තමන්ගේ වී සමුපකාරයට විකුණනවා. ඒ වගේම ඔහු බිත්තර වී පිළියෙල කරල ඒවා කෘෂිකර්ම මධ්‍යස්ථානයට විකුණනව.

ඔහුගේ ගොඩ ඉඩම් වල ලූනු, බතල, මුංඇට, මිරිස්, මයියොක්කා, කෙසෙල්, බඩ ඉරිඟු ආදිය වවල තිබුන. ලොකු මහත්මයා මහතා එකම ඉඩමේ නොයෙක් බෝග ජාති එකවර හොඳින් වගා කර තිබුන. මුංඇට සහ

කොල්ලු, ගොඩ වී සහ බීට්රූට් අල ආදිය නවීන ක්‍රම පාවිච්චි කරල තමන්ගේ ගොඩ ඉඩම් වල වවන බව ඔහු ප්‍රකාශ කළා.

හාල් සලාකය අඩු කරපු දින වල ඉඳලම ගොවිකටයුතු ගැන දූන් ලොකු උනන්දුවක් ඒ පළාතේ තිබෙන බව ලොකුමහත්මයා මහතා කියා සිටියා. ඔහු කියන හැටියට කලින් වගේ සල්ලි වලට කුලිය ගෙවනවට වඩා වී වලින් කුලිය දෙනවනම් කුලී කාරයෝ කැමති බවයි, පෙනෙන්න තියෙන්නෙ. ගොවීතැන් කටයුතු සඳහා ඇති උනන්දුව කොච්චරද කිව්වොත් දවසකට ගොවි මහත් වරු 50 ක් විතර නොයෙක් දේවල් ගැන කරුණු දූන ගන්නත් බීජ සහ පැල වර්ග ලබා ගන්නත් කෘෂිකර්ම මධ්‍යස්ථානයට පැමිණෙන බව ඔහු කීව.

ලොකුමහත්මයා මහතා පේරාදේණියේ දී පුහුණුවක් ලබන කාලෙදි දූක්ක උප කරණයක් විදියට ගොයම් පාගන්න උප කරණයක් පිළියෙල කරගෙන තියෙනව. ලොකු කොස් කොට දෙකකට තැනින් තැන කම්බි ඇණ සවි කරල තියෙන මේ උපකර ණය අත් ට්‍රැක්ටරයකට යාකරල ගොයම් පෑගීම හුහක් පහසු බව ඔහු පෙන්වා දුන්න. (පින්තූරය බලන්න) ඒ යන්ත්‍රයෙන් දවසකට බුසල් 50 ක් විතර ගොයම් පාගා ගන්නට පුළුවන් බව ඔහු කීව.



ගොයම පාගන්න හද ගත් උපකරණය

ලොකුමහත්මයා මහතාට මීහරක් 10 දෙනකුත් එළ හරක් 8 දෙනෙකුත් ඉන්නව. ගොවිතැන් බත් කරන අයට හරකුන් නැතිවම බැරියැයි ඔහු කීව.

ලොකුමහත්මයා මහතා හොඳින් ගොවි තැන් කරගෙන හුහක් සාර්තක ජීවිතයක් ගත කරන කෙනෙක් බව පිළිගත්ත. ඔහුගේ භාර්‍යාව ඒ පළාතේ අයට නොමිළයේ ඇස් වෙදකම් කරන බවද ඔහු ප්‍රකාශ කළා.

× × ×

**ගොඩකවෙල, හොරේපොල, බී. ඩබ්ලිව්. ධර්මසේන මහතා සහ ජී. එල්. පීරිස්හාමි මහතා** ගොඩ මඩ ඉඩම් අක්කර 2 1/2 පමණ හවුලෙ වැඩ කරනව.

මේ දෙන්නා තමන්ගේ ඉඩම් වල එක අවුරුද්දක කන්න දෙකම වී වවනව. අනෙක් කන්නෙ එළවලු වවනව. එහෙම කරන්නේ වී වවන්න වතුර ලබා ගන්න පුළුවන් ඒ විදියට හින්දයි. ඔවුන් වගා කරන්නේ නින්ද– ගම් ඉඩමක්. රාජකාරිය කියන ඉඩම් භුක්ති ක්‍රමයේ හැටියට ඉඩම අයිති කෙනෙක් හිටි යත් සමහර වෙලාවට ඒ ඉඩම වැඩ කරන අඳ ගොවියන්ද ඉන්න බව ඔව්හු ප්‍රකාශ කළා. ගොයම් කපා පාගා අස්වැන්න ගත්තහම අඳ ගොවියා අස්වැන්නෙන් කොටසක් රාජකාරිය කරන කෙනාට දෙනව. සමහර විට කෙළින්ම දේවාලෙට අඳේ දෙන අයත් ඉන්න බව ඔව්හු කියා සිටිය.

කලින් මේ දෙන්නම හොරපේපොළ විවිධ සේවා සමුපකාර සමිතියෙන් ණය අර ගෙන තියෙනව. ඒ වතාවේ දී ඒ ණය වලට මුද්දර ගාස්තුවක් ගෙව්වෙ නැහැ. ඒ වුනත් මේ පාර මුද්දර ගාස්තුවක් ගෙවන්න සිදුවෙලා තියෙනවා. ඒ අය කියන හැටියට සමුපකාර යෙන් දෙන ණය කොටස් කරල තියෙන හැටි හරි නැහැ. පොළව සකස් කරන්න රුපියල් 70 කුත්, බිත්තර වී වලට රු 35 කුත්, පෝරවලට රු. 70 කුත්, වල් පැලෑටි වඳ කරන්න රු. 50 කුත්, අස්වැන්න කපා පාගා ගන්න රු. 50 කුත් වශයෙන් ණය මුදල් කොටස් කරල තියෙනව. වල් පැලෑටි වඳ කරන්න දෙන ණය මුදලට රු. 30 ක් විතර තියෙනව නම් හොඳටම ඇති. ඔවුන්

කියන්නේ පෝර වලටත් බිත්තර වී වලටත් දෙන ණය මුදල වැඩි කරන්න ඕනෑ බවයි.

ධර්මසේන මහතා සහ පීරිස් හාමි මහතා තමන්ගේ කුඹුරු හාන්නේ හරකුන්ගෙන්. හරක් බානකට දවසකට රු. 10 ක් විතර හරක් අයිති කරුවෝ අය කරන බව ඔව්හු කියා සිටිය. ගොවි කාරක සභාවට අත් ට්‍රැක්ටර් නැහැ. ඒ වුනත් ඒ ගොවි කාරක සභාව ටිකක් උනන්දුවෙන් වැඩ කරන බව ඔව්හු ප්‍රකාශ කළා.

තමන්ගේ ගොඩ ඉඩම් සුලු ප්‍රමාණයක පොල් වවා ඇති බවත් පොල් ගස් අතර වෙනත් දේවල් වැවීමට පස එතරම් හොඳ නැති බවත් ඔව්හු පැවසුව.

ගොවිතැන ගැන හැම කෙනෙක් තුළම ලොකු උනන්දුවක් ඒ පළාතේ තියෙන බව කී ධර්මසේන මහතා සහ පීරිස් හාමි මහතා කුඹුරු වැඩ කිරීමට වගේම ගොඩ ඉඩම් වල වෙන වෙනම අල වර්ග ආදිය වැවීමටත් ඒ පළාතේ අය හුඟක් කැමැත්තක් දක්වන බව අවසාන වශයෙන් කියා සිටියා.

× × ×

**ගොඩකවෙල, රාහුල කණිෂ්ඨ විද්‍යාලයේ උගන්වන එම්. එස්. වේරහැර** මහතා ඒ පාසැලේ ගොවිතැන් කටයුතු පිළිබඳව උනන්දුවෙන් වැඩ කරන කෙනෙක්. ඔහු ඉස්කෝලෙ වත්තෙම අක්කර 2 ක පමණ පරණ හේන් ක්‍රමයට ගොවිතැන් කරල අත්හද බැලීමක් කරල තියෙනව. මෙයින් අක්කර 1 1/2 ක විතර ගොඩ ඉඩම් වල කුරක්කන්, මුංඇට, බතල, බඩ ඉරිඟු, මයි-යොක්කා ආදිය එක‍ට වවල තියෙනව. ඉස්සර වෙලාම අස්වැන්න ලබා ගන්නෙ මුංඇට වලින්. ඒ මුංඇට අස්වැන්න ගත්හම එයින් ඉතුරු වන කොළ ආදිය මයියොක්කා ගස්වලට පෝර හැටියට යොදනව. මෙය පරණ හේන් ක්‍රමයම අලුත් විදියට කිරීමක්.

පාසැලේ ළමයින් ලවාද ගොවිතැන් කරවන වේරහැර මහතා එයින් ලැබෙන ආදයම ළමයින්ගේ බැංකු පොත්වල



තැන්පත් කිරීමට කටයුතු කර ඇති බව ප්‍රකාශ කළා. ළමයින් ලබන ආදයමෙන් කාලක් ඒ ඉස්කෝලෙ ගොවි කටයුතු අරමුදලට තබා ගන්නව. ඔහු කියා සිටියේ ළමයින් හිටවපු මයියොක්කා, රාත්තල සත 10 බැගින් අඩු ගණනේ රාත්තල් 5 ගණනෙ වත් ඒ ළමයින් ටම විකුණන බවයි.



හේන් ක්‍රමයට අලුත් මුහුණුවරක් දෙන වේරහැර මහතා

දුප්පත් ගෙවල්වල හුඟක් වෙලාවට දූන් ආහාර හිඟකම ටිකක් තදින් දැනෙන හින්ද ළමයින්ට ඒ ගැන දූන් දූන් දැනීමක් ඇතුව ගොවිතැන් වැඩ කටයුතු ගැන ආසාවක් දක්වන බව වේරහැර මහතා ප්‍රකාශ කළා. ඒ ඉස්කෝලෙ ළමයි ඉස්කෝලෙ වත්තෙ එක කොටසක කුරක්කන් විතරක් තනිකර වවල තියෙනව. ගොවි කටයුතුවලට ලොකු උදව්වක් තමන් නිතරම දෙන බව වේරහැර මහතා පැවසුව.

× × ×

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙඩම්ගස්ලන්ද, වරායාය වත්තේ, හෙන්රි ප්‍රනාන්දු** මහතා

අවුරුදු 15 විතර ඉඳන් ගොවිතැන් කටයුතුවල යෙදී සිටින්නෙක්. ඔහු ගොවිතැනින්ම ජීවිතය හුඟක් සරු කරගෙන තියෙනව.

හෙන්රි ප්‍රනාන්දු මහතා කියන හැටියට ඔහු ගොවිතැන් කටයුතු පටන් ගත්තේ බොහොම සුලුවෙන්. ඒ වුනත් දන් ඔහුට අයිති අක්කර 8 ක පමණ කුඹුරු වලින් වී බුසල් 700 ක විතර ආදායමක් ලැබෙන බව හෙන්රි ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කළා. ඔහු කියන හැටියට කුඹුරු වැඩ කිරීමට කරදරයක් ව ඇත්තේ වතුර ප්‍රශ්නයයි. බොහෝ කාලයකට ඉස්සර ඒ කුඹුරු යාය—වලට වතුර ලබාගත් වැව් දෙකක්ම තිබුන බවට ලකුණු තියෙන බව ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කළා. මේ වැව් දැන් කැඩී බිඳී ගොස් ගොඩ වෙලා. ඒ වැව් දෙක අලුත්වැඩියා කරන්න පුළුවන් නම් ඒ යායේ කුඹුරු වැඩ කරන්න කිසිම කරදරයක් ඇති නොවන බව ඔහු කීව. මේ වැව් වලට අයිති හරියේ සමහර අය ගොවිතැන් කර ඇති බවත් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කළා.

ප්‍රනාන්දු මහතා ටිකක් ලොකුවට ගොවිතැන් කරන කෙනෙක් හින්ද පොර, රසායනික බෙහෙත් ආදිය තොග ගණනේ තියා ගන්නව. ඒ අතින් ඔහුට වැඩි කරදරයක් නැහැ.



පොල් වගාවේම සරුවට වැවුනු ඉඳල් ඉරිඟු සහ තෝර පරිප්පු

ඔහුගේ වත්තේ අක්කර 6 ක පමණ, හොඳට සරුවට ඉඳල් ඉරිඟු වවා තිබුන. මේ ඉඳල් ඉරිඟු අතර බතලත්, තෝර පරිප්පුත් වවා තිබුන. පොල්ගස් අතරතුර තැනින් තැන සෝයා බෝංචි, මුංඇට, මයියොක්කා ආදිය ප්‍රනාන්දු මහතා වවා තිබුනේ පොල් වගාව අතරතුර නොයෙකුත් බෝග ජාති හොඳින් වවන්න පුළුවන් බව ඔප්පු කරමිනුයි. අක්කර 3/4 ක පමණ ඉඳල් ඉරිඟු වගාවෙන් ඔහු රු. 2000 ක ආදායමක් ලබාගත් බව ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කළා.

තමන් ගොවිතැනින් පමණක් යැපෙන කෙනෙක් බව කී ප්‍රනාන්දු මහතා ඉඳල් ඉරිඟු සහ සෝයා බෝංචි වවන්නට ඕනෑ තරම් බීජ පැල්වැහැර හෝ මහඉලුප්පල්ලම ගොවිපළවල් වලින් ලබා ගැනීමට නොහැකි වූ බව කියා සිටිය. ඔහු තවත් ආදායම් ලැබෙන මාර්ගයක් හැටියට මී මැස්සන් ඇති කරන්නටද අදහස් කරනව.

× × ×

**නක්කාවත්ත, මුරුතැන්ගේ, පර්ල් ඇඹෝගම වත්තේගෙදර මහත්මිය** ඒ පළාතේ ''පරාක්‍රම තරුණ ගොවි සමාජයේ'' සාමාජිකාවක්. ඇය දරුවන් තුන්දෙනෙකුගේ මවක්. 1966 සිට ගොවිතැන් කටයුතු ගැන උනන්දුවක් දක්වන ඇඹෝගම මහත්මිය අක්කර 2 1/2 ක පමණ ගොඩ ඉඩම් සහ අක්කරයක වී ද ගොවිතැන් කරනව. ඇය මේ ගොවිතැන් කටයුතු වලට තවම ණය මුදලක් අරගෙන නැහැ. ඇය පොර ලබාගන්නේ බිහල්පොල විවිධ සේවා සමුපකාර සමිතියෙන්. ඇය කියන හැටියට සමුපකාර ක්‍රමය අනුව කරදරයක් නැතිව පොර ලබා ගන්න පුළුවන්.

බිහල්පොල ගොවි කාරක සභාවට තියෙන්නෙ එක බෙහෙත් ඉසින යන්ත්‍රයයි. එය කොහොමටවත් ප්‍රමාණවත් නැහැ. ඒ පළාතෙ උදළු හිඟයක්ද පවතින බව ඇයගේ අදහසයි. ඇඹෝගම මහත්මියට අයිති ගෙවත්තේ ඉඳල් ඉරිඟු, කව්පි, වැල් දෙඩම්, කිරි අල, අන්නාසි, බතල, කෙසෙල්, ලූනු ආදී බෝග ජාති ගණනාවක්ම වවල තිබුනේ ඒ ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකගෙන් උපදෙස් අරගෙන ඒ උපදෙස් පිළිවෙලටයි.

ඇය කිවුව හැටියට වැල් දෙඩම්වලින් සතියට රු 12 ක විතර ආදායමකුත්, බිත්තර

වලින් රු. 40 ක විතර ආදායමකුත් ඇයට ලැබෙනව.



වත්තේගෙදර මහත්මිය වැල් දෙඩම් වලින් සෑහෙන ආදායමක් ලබා ගන්නවා.

හාල් සලාකය අඩු කිරීම ගැන ඇය කියා සිටියෙ, ඒ හින්ද උදැල්ලෙන් වැඩ කරන්න ඉබාහෝ අයට දූන් අවස්ථාවක් ලැබිල තියෙන බවයි. ඇය පවසන හැටියට සාමන්‍ය-යෙන් ඒ ප්‍රදේශයේ අයට කෑම අතින් වැඩිම කරදරයක් නැහැ. කොස් දෙල් ආදියත් ටික ටික තියෙන හින්ද හාල් නැති අයටත් ඒ ආහාර වලින් වේලක් පිරිමහ ගන්න පුළුවන්. ඒත් හාල් සලාකයෙන්ම යැපෙන අයත් ඉන්නව.

තමන් කරන ගොවිතැන් කටයුතුවලට තමන්ගේ දූ දරුවන්ද උදව් කරන බව කී ඇඹෝගම මහත්මිය මුළු ගමේම ගොවිතැන් කටයුතුවලට ''පරාක්‍රම තරුණ ගොවි සමාජය'' ලොකු අනුබලයක් බව කියා සිටිය. ඒ සමාජයේ එක සාමාජිකයෙක් මාස 6 කට පුහුණුවක් ලබන්න ඇමෙරිකාවට ගිය බවත් ඇය වැඩිදුරටත් කියා සිටියා.

ඇඹෝගම මහත්මිය මේ වැවිලි කටයුතු වලට පැල සහ බීජ වර්ග ලබා ගන්නේ කෘෂිකර්ම මධ්‍යස්ථානයෙන්. ඒවා ලබා ගැනීමට කිසිම කරදරයක් ඇයට නැති බවයි ඇය කීවේ. ගෙවත්තේ පොල්ගස් දූන් හුහක් පරණ හින්ද ඒවා ටිකක් අඩුකර වෙන බෝග ජාති වවන්න ඇය අදහස් කරන බව ඇඹෝ-ගම මහත්මිය අවසාන වශයෙන් කියා සිටිය.

× × ×

**බලල්ලේ, අඹගස් වැව, එගොඩයාගම වත්තේ, ජේ. කේ. ඒ. ජයකොඩි** මහතා වයස අවුරුදු 23 ක තරුණයෙක්. ඔහු ජ්‍යෙෂ්ඨ-යෙන් ද සමත්ව තියෙනව.

තාත්තත් එක්ක ගොඩ ඉඩම් අක්කර 4 කුත් කුඹුරු අක්කර 8 කුත් වැඩ කරන ජයකොඩි මහතා ගොඩ ඉඩම්වල සෝයා බෝංචි, රතු ලූනු, රට කජු, ආලින්ටන් මෑ, ආදිය වවල තියෙනව. මේව වවන්නට ජයකොඩි මහතා ණය මුදල් අරගෙන නැහැ. කුඹුරු අක්කර 8 ක් තිබුණත් මේ කන්නයේ ජයකොඩි මහතාට වගා කරන්න පුළුවන් උනේ අක්කර 1 1/2 ක් පමණයි. ඔහු මේ වැඩට වතුර ලබා ගන්නේ ඇලකින් වතුර පොම්ප කරලයි. වැවක් තිබුනත් ඉඩෝරය හින්ද ඒ වැව සම්පූර්ණයෙන්ම හිඳිල තිබුන. ඔහු කුඹුරු වැඩට ණය ගත්තේ මහව විවිධ සේවා සමුපකාර සමිතියේ අඹගස්වැව ප්‍රාදේශි කයෙන්. මේ පාර කුඹුරු වැඩ කරන්න රු. 900 ක් ණයට ගත්ත බවත් කලින් කන්නයේ රු. 2500 ක් අරගෙන එය ගෙවා ඉවර කළ බවත් ජයකොඩි මහතා කීව. අවුරුදු 5 ක සිට මේ විදියට ණය ගත්ත ජයකොඩි මහතාට ණය මුදල් ගන්න මොනම කරදරයක්වත් නැත්තෙ ඒ ණය මුදල් කලට වේලාවට ආපසු ගෙවන හින්දයි. බැංකුවෙන් ණය මුදල් ගන්න පරක්කු නම් සමුපකාර සමිතියේ සල්ලිවලින් වත් ඒ ණය මුදල තමන්ට දෙන බව ජයකොඩි මහතා කියා සිටියා.

කලින් නම් සමුපකාරයෙන් පෝර ලබා ගන්න ටිකක් අමාරු උනා. එහෙම උනේ සමුපකාර සමිතියට ගේන පෝර ගබඩා කරල තියන්න තැනක් නැති උන හින්දයි. ඒ උනත් දූන් ගබඩාවක් තියෙන හින්ද සමුප-කාරය ගොවියන්ට ඇති තරම් පෝර ගබඩා කර තබා ගන්න බව ජයකොඩි මහතා ප්‍රකාශ කළා.

ලංකා බැංකුවෙන් ලැබුණ ණයක් යොද-වල ගත්ත රෝද දෙකේ ට්‍රැක්ටරයක් ඔහුට තියෙනව. කුලී කරුවන් ද තමන්ගේ වැඩට යොදවන බව ජයකොඩි මහතා කීව. කුඹුරු වැඩට තියෙන ලොකුම අවහිරය, ජයකොඩි මහතා කියන හැටියට වාර්මාරිග පහසුකම්

නැතිකමයි. ඔහු කියන හැටියට ඒ ගමට අයිති වැව් 10 ක් විතර තියෙනව. එගොඩයා ගම වැව, අඹගස් වැව, හිඳගම වැව, හබ වැව, නැටියගම වැව ආදියයි. මේ වැව් අවුරුදු 10 කින් 15 කින් අලුත්වැඩියා කරල නැහැ.

ගොවි කාරක සභාව ගැන කතා කරමින් ජයකොඩි මහතා කිව්වෙ ඒ පළාතේ ගොවි කාරක සභාව ගොවි මහතුන්ගේ අඩුපාඩුකම් ආදිය ගැන සොයා බලන බවයි.

ඒ පළාතේ අය වැඩියෙන් කැමති හේන් ක්‍රමයට ගොවිතැන් කරන්නට කියල ඔහු කිවුව. කුරක්කන් එහෙම වැඩියෙන් වවන ගොවියා දූන් මය්යොක්කා, බතල ආදියත් වවන්න කැමතියි.

ඔහු වවා තියෙන්නෙ බී.ජී. 34/8 වී වර්ගයයි. හොඳට පෝර කාරිය යෙදුවොත් මෙයින් අක්කරයකට වී බුසල් 100 ක් විතර ලබා ගන්න පුළුවන් බව ජයකොඩි මහතා කිව.

වෙන මොනම රස්සාවකටවත් යාමට තමන්ගේ කැමැත්තක් නැති බව කී ජයකොඩි මහතා ඉදිරියටත් රස්සාවක් වශයෙන් ටිකක් ලොකුවට ගොවිතැන් කිරීමට අදහස් කරන බව වැඩිමනත් ප්‍රකාශ කළා. ඔහු අදහස් කරන්නේ ගොවිතැන හොඳ ආදායම් මාර්ගයක් බවයි.

ඒ පළාතේ ඉඩම් ගැන ප්‍රශ්නයක් නම් නැහැ. රජයේ ඉඩම් ඕනෑ තරම් තියෙනව.

ජයකොඩි මහතා ගුවන් විදුලි වැඩ සට හන් ගැනත් කතා කළා. තරුණ ගොවි සමාජ වැඩ සටහනුත්, සංවර්ධන සංදර්ශන වැඩ සටහනුත් හුඟක් හොඳ බව කී ජයකොඩි මහතා තවත් කිවුවෙ ඇත්ත වශයෙන්ම ගොවිතැන් කටයුතු කරන ගොවි මහතුන් සමග සාකච්ඡා කරල ඒ වැඩ සටහන් ඉදිරිපත් කරනව නම් ඊට වඩා හුඟක් හොඳ බවයි.

× × ×

**මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවුර්හි, කාටු- පල්ලි පාරේ, මොහොමමදු කාසිම් තම්බිරාසා** මහතා වයස අවුරුදු 45 ක ගොවි මහතෙක්. ඔහු හුඟක් සරුවට ගොවිතැන් කරගෙන යන කෙනෙක්. ඒ වුනත් කලින් පොහොසත් ගොවියෙකුගේ ගොවිපලක කුරුල්ලන් එළවන කෙනෙක් හැටියට ගොවි ජීවිතය පටන් ගත් බව කී තම්බිරාසා මහතා දූන් ඔහුට ගමේ අනෙකුත් අය ''පෝඩියාර්'' කියල කතා කරන බව ඔහු කියා සිටිය. ''පෝඩියාර්'' කියන්නේ අතමිට සරු ගොවියකුටයි. තම්බිරාසා මහතා දරුවන් 6 දෙනෙකුගේ පියෙක්. ඔහුගේ කුඩා පිරිමි ළමයි නිවාඩු කාලයේ දී ගොවිතැන් වැඩට ඔහුට උදව් කරන බව තම්බිරාසා මහතා කිවුව.

තම්බිරාසා මහතාට අයිති ඉඩම් නැහැ. ඔහු අක්කර 10 ක් විතර ආණ්ඩුවේ ඉඩම් එළි පෙහෙළි කරල වවා තියෙනව. වී ගොවි තැන් කරන්න තම්බිරාසා මහතා වෙනත් අයගෙන් ඉඩම් බදු ගන්නව. මේ විදියට මහ කන්නයේදී වී වවන්න අක්කර 35 ක් විතර බදු ගන්න බවයි, තම්බිරාසා මහතා කිව්වෙ. ගොඩ ඉඩම් අක්කර 5 ක විතර ඔහු ලූනු, මිරිස් ආදියත් වගා කරනව.

තම්බිරාසා මහතා කියන හැටියට අක්කර යක වී ගොවිතැන් කරන්න රු. 500/- ක් විතර වියදම් වෙනව. මේවට ඔහු ණය ගන්නේ එරාවුර් විවිධ සේවා සමුපකාර සමිතියෙන්. ඔහුට ඕන කරන ණය මුදල් සමුපකාරයෙන් කලට වේලාවට ලැබෙන්නෙ නැති බව ඔහු පැවසුව. තම්බිරාසා මහතා මේ කන්නයේ ගත්ත ණය මුදල් ඔක්කොම ගෙවා තියෙනව. ඔහු පෝර ගන්නෙත් සමුපකාරයෙන්. සමුපකාරයෙන් පෝර දෙන්නට කල් ගතවෙනව. තම්බිරාසා මහතා කිව්වේ සමුපකාරයෙන් ණය මුදල් ලබා ගන්නට බැරි වුනත් ඔහු ටිකක් සරුවට ගොවිතැන් කරන හින්ද ණයක් ගැනීමට එච්චර කරදරයක් නැතිබවයි. ඒත් පුළුවෙන් ගොවිතැන් කරන අයට නම් ණය ගැනීම හුඟක් කරදරයි. ඔහු කිවූ හැටියට ගොවිතැන් වැඩ කරන්න රත්තරන් බඩු ආදියත් දේපලත් ඔහු සමහර වෙලාවට උගසට තියනව. තම්බි රාසා මහතා එළවන් හා හරක් ද ඇති කරන හින්ද මුදල් ඕන වුනහම ඔහු උන්වත්

විකුණනවා. සමුපකාරයෙන් ණය ලැබුනහම උගස් කරපු දේවල් බේරාගන්නා බව කිව්ව.

තම්බි රාසා මහතා ගොවි කාරක සභාවේ සාමාජිකයෙක්. ඔහු ගොවිතැන් කරන ඉඩම තියෙන්නේ වර්පවට්ටුවන් කියන ගමෙයි. තම්බිරාසා මහතා කිවුවේ ඒ ප්‍රදේශයට වැඩි කරදරයක් නැතිව වාරි මාර්ග පහසුකම් ලබාගත හැකි බවයි. ඔහු කිවූ හැටියට වාරිමාර්ග පහසුකම් ලැබුනොත් අක්කර 4000 ක් විතර කරදරයක් නැතිව වගා කරන්න පුළුවන්.

තම්බිරාසා මහතා තමාගේ සහෝදරයත් එක්ක හවුල් වෙලා සැරෙන් සැරේ මුදල් ගෙවන ක්‍රමයට ලොකු ට්‍රැක්ටරයක් අරගෙන තියෙනව. එයට රු. 33,000/- ක් විතර ඔහුට වියදම් වුනා. මේ ට්‍රැක්ටරය ඔහු යොදවන්නෙ ඔහුගේ කුඹුරු වැඩවලට සහ සහෝදරයාගේ කුඹුරු වැඩ වලටයි. ඔහු කීවේ වෙනත් දුප්පත් අයට ඕනෑ උනහම ඒ අයගේ කුඹුරු වැඩවලටත් මේ ට්‍රැක්ටරය දෙන බවයි, ඔහු එය කුලියට දෙන්නෙ නැහැ. සමහර වෙලාවට, ට්‍රැක්ටරයෙන් වැඩ ගත්ත අයගෙ අස්වැන්න සරු වුනොත් කුලිය හැටියට පොඩි මුදලක් තමන්ට ලැබෙන බව තම්බිරාසා මහතා ප්‍රකාශ කළා.

ඔහු බීජ වී ලබා ගන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන්. ඒ වගේම ඔහු දෙපාර්තමේන්තුවටත් බීජ වී දෙනව. තමාගේ ප්‍රයෝජනයට වී තියාගෙන ඉතිරි වී සමුපකාර යට විකුණන බව ඔහු කිවුව. වී විකුණන්න කිසිම කරදරයක් නැති බව ඔහුගේ අදහසයි.

හාල් සලාකය අඩු කිරීම ගැන ඔහු කීවේ, මේ කාලය හාල් සලාකය අඩු කිරීමට හොඳ කාලයක් නෙවෙයි කියලයි. කුඹුරු වැඩ කර ගන්නට කලට වෙලාවට වතුර ලැබෙනව නම් හාල් කොහෙත්ම නැතිවුනත් ඒක එච්චර ප්‍රශ්නයක් නෙවෙයි. දැන් ගොවි තැන් කිරීමට වතුර නැති හින්ද ගොවිතැන් කටයුතු කරගෙන යන්න අනෙක් ගොවීන්ට කොහෙත්ම පුළුවන්කමක් නැති බව ඔහු කියා සිටිය. ඒ පළාතේ ඉඩම් පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ප්‍රශ්නය නම් වතුර ප්‍රශ්නයයි.

වී මිළ වැඩි කිරීම තම්බිරාසා මහතා කියන හැටියට ගොවි මහතුන්ට කරපු ලොකු උදව්වක්. වී මිළ වැඩි කිරීම හින්ද වී ගොවි තැන නතර කරන්න උන්න අයත් දැන් ගොවිතැන් කරන්න ලොකු උනන්දුවක් දක්වන බව ඔහුගේ අදහසයි.

ඔහු කියන හැටියට ඒ පළාතේ තැන් තැන් වල ගලා යන ඇල දෙල තියෙන හින්ද වතුර පොම්ප තියනවනම් ගොවිතැන් කටයුතු කරන්න හුඟක් පහසුයි. වතුර පොම්ප මිළට ගන්න වෙළඳ පොලෙත් ඕනෑ තරම් නැති හින්ද මේ ප්‍රශ්නය ටිකක් බරුරුම් වෙලා තියෙනව. ආණ්ඩුවෙන් වත් කුලියට දෙන වතුර පොම්ප තියනව නම් එය ගොවි මහතුන්ට කරන ලොකු උදව්වක් බව තම්බි රාසා මහතා කියා සිටිය. තම්බිරාසා මහතාට නම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් වතුර පොම්පයක් කුලියට දීල තියෙනව. ඔහු කීවෙ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඒ වගේ වතුර පොම්ප කුලියට දෙන්නේ කලට වේලාවට පිළිවෙලකට වැඩ කරන හොඳ ගොවියන්ට පමණක් බවයි.

x x x

**මොරකටන්වෙන, සන්ධිවෙලිහි, එස්. සිනිතම්බි** මහතා අවුරුදු 20 ක් විතර කාලයක් තුළ ගොවිතැන් කරපු කෙනෙක්. සිනිතම්බි මහතා කියපු හැටියට යල කන්නයේ අක්කර 10 ක් විතරත්, මහකන්නයේ අක්කර 30 ක් විතරත් ඔහු ගොවිතැන් කරනව. මෙයින් සිනිතම්බි මහතාට අයිතිව තියෙන්නෙ අක්කර 9 යි. අනෙක්වා වෙනත් අයගෙන් ඔහු කුලියට ගන්නව. කුලියට ගන්න ඒවායින් අක්කර 12ක් විතර සන්ධිවෙලි, විනායගර් පන්සලට අයිති ඉඩම්. මේ ඉඩම් අවුරුද්දකට සැරයක් වෙන්දේසි කර කුලියට දෙන බව සිනිතම්බි මහතා කිවුව. සාමාන්‍යයෙන් අවුරුද්දකට අක්කරයකට රු. 1300/- ක විතර කුලියක් සල්ලිවලින් පන්සලට ගෙවන්නට ඕනෑ. වෙන්දෙසිය ඉවර වුන හැටියෙම ගෙවිය යුතු කුලියෙන් 25% ක් ගෙවල ඉතිරි මුදල මාසයක් ඇතුළත ගෙවන්න ඕනෑයයි ඔහු කීව. අනෙක් ඉඩම් ඔහු කුලියට අරන් තියෙන්නෙ වෙනත් අයිතිකාරයෙකුගෙන්.

ඔහු වී හැරෙන්නට කුරක්කන්, බඩ ඉරිඟු, ඉදල් ඉරිඟු ආදියත් ගෙවත්තෙ වවල තියෙනව.

සීනිතම්බි මහතා ගොවිතැන් කටයුතු කරන්න සල්ලි ණයට ගන්නව. ඔහු ඒ ණය ගන්නේ වාලච්චේන විවිධ සේවා සමූපකාර සමිතියෙන්. ඔහු කීවේ මේ සමූපකාර සමිති යෙන් ණය මුදල් තමන්ට ඕන කරන වෙලා වට ලැබෙන්න නැති බවයි. ජූනි මාසයේ ඉල්ලපු ණය මුදලක් තමන්ට ලැබුනෙ ඔක්තෝබර් මාසයේදී බවත් තවත් බොහෝ දෙනෙකුට කොහොමවත් ණය මුදල් නොලැබුන බවත් සීනිතම්බි මහතා කියා සිටියා මේ නිසා ඒ අයට කණකර ආබරණ ආදිය උගස් තියන්න හුඟක් වෙලාවට සිදුවන බව සීනිතම්බි මහතා ගේ අදසහයි. පෝර ලැබෙන් නෙත් ඒ විදියටමයි. වී වපුරන්නට ඉස්සර වෙලා ඉහින්න තියෙන පෝර හුඟක් වෙලාවට ලැබෙන්නෙ වී වැපුරුවටත් පස්සෙ.

සීනිතම්බි මහතා කුඹුරුවලට ඉහින්නෙ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙ බෙහෙත් වර්ගයි. ඔහු කීවෙ කාලයක හිටන්ම පාවිච්චි කරන්නෙ ඒ බෙහෙත් බවයි.

ඒ පළාතෙ හුඟක් අය කලින් කන්නයේ ගත්ත ණය මුදල් තවම ගෙවා නැති බව සීනිතම්බි මහතා කියා සිටිය. හුඟක් වෙලාවට ණය ගෙවන්න බැරි වෙන්නෙ ගංවතුරක් නැත්නම් නියඟයක් හින්දයි. සීනිතම්බි මහතා කියන්නේ කන්නය පාලුවුනේ නැත් නම් ණය ගෙවන්නේ නැතුව ඉන්නට කොහෙත්ම හේතුවක් නැතිබවයි.

බීජ වී ලබාගන්න කිසි කරදරයක් නැති බව සිනිතම්බි මහතා කිවුව.

ඔහු වී විකුණන්නේ පෙරියමන්මාට සමූපකාර ප්‍රාදේශිකයටයි. සමූපකාරෙ වී ගන්න එක පිළිවෙළකට කෙරෙන්නෙ නැහැයි කියල ඔහු කිවුව. වී ගන්නකොට පළමුවැනි ශ්‍රේණියේ දෙවැනි ශ්‍රේණියේ වී කියල වෙන වෙනම කොටස් කරනව. ඒ විදියට කොටස් කරන්නේ ඒ සමූපකාරයේ කළමනාකාර මහත්තය. ඔහු කීවෙ ඔහුගේ වී පළමුවැනි ශ්‍රේණියේ හැටියට කොටස් කළත් ඔහුගේ කුඹුරු වැඩ කරපු අයට කුලිය හැටියට ඔහු දුන්න ඔහුගේම වී සමූපකාරයේ දී දෙවැනි ශ්‍රේණියේ හැටියට කොටස් කළ බවයි.

මේ වාගෙ වෙලාවලදී ගොවි මහතුන් අතර සැකයක් ඇති වන බව සීනිතම්බි මහතා කියා සිටිය. තවත් ප්‍රශ්නයක් මතු කරමින් සීනිතම්බි මහතා කීවෙ රාත්තල් 117 කිරන වී ගෝනිය කට ගෝනි බර හැටියට රාත්තල් 5 ක් අඩු කරන බවයි. ඔහු කිවූ හැටියට සමහර වෙනත් තැන්වල මෙයට අඩු කරන්නේ රාත්තල් 1 1/2යි නැත්නම් 2 යි. ඒ වුනත් මේ වගේ දේවල් ගැන කවුරුවත් ඉදිරිපත් වෙන්නෙ නැත්තෙ වී විකුණන්න ආයෙත් පාරක් සමූපකාරයේ කළමනාකාර මහත්තය ළඟටම යාමට සිද්ද වෙන නිසා බව සීනිතම්බි මහතා ප්‍රකාශ කළා. තාරවායි, කුඩිම්බිමලේ, පල්ලතුවේන ආදී තැන්වල වී මිළට ගන්න ස්ථාන තිබුනත් ගෝනි නැහැයි කියා ගොවීන්ගේ වී සමහර වෙලාවට ගන්නෙ නැති බව සීනිතම්බි මහතා කියා සිටිය. එතකොට ගොවීන්ට සිදු වන්නේ තමන්ගේ අතින්ම සල්ලි ගෙවල සන්ධිවේලි, කිරාන් ආදී ස්ථානවලට වී ගෙනයාමටයි. මෙයත් ගොවීන්ට ලොකු කරදරයක් බව සීනිතම්බි මහතා කීව. ඔහු කීවෙ මොනව වුනත් ගෝනිය කට රාත්තල් පහක් අඩු කිරීම නම් අඩුවෙන් වී විකුණන ගොවි මහත්වරුන්ට විඳගන්න බැරි පාඩුවක් බවයි.

ඇළ දෙළ සුද්ද පවිත්‍ර කිරීමෙ වැඩ ගොවි කාරක සභාව වැඩි සැළකිල්ලකින් කරන්නේ නැහැයි කියල සිනිතම්බි මහතා කිච්ච. අක්කර බද්ද අය කරන්න නම් ඒ අය කටයුතු කරනව. ඔහු කීවෙ පලද වර්ධන කමිටුව හරියට වැඩ කළොත් එය ගොවි මහත්වරුන්ට ලොකු සහනයක් වන බවයි. ගොවි කාරක සභාව ගොවි මහතුන්ගේ වැඩ කටයුතු ගැන ගොවි මහත්වරුන් හමුවෙනවා වෙනුවට නිතරම නිලධාරි මහත්වරු හමුවන්නට යන බව කී සීනිතම්බි මහතා මේ විදියට ගියාම පළාතේ දියුණුවට කෙරෙන වැඩකටයුතු වලට ගොවි මහතුන්ගේ අදහස් නොලැබෙන බව කියා සිටිය. අමුණුවල වතුර පාරවල් හරස් කරන්න වාරි මාර්ග දෙපාර්තමේන්තුවෙන් දීල තියෙන ලී, සමහර මිනිස්සු පෞද්ගලික ප්‍රයෝජනයට

ගන්නව. ඒවා පරෙස්සම් කරන්නට වැඩ පිළිවෙලක් යොදන්නවත් ගොවි කාරක සභාව උනන්දුවක් නැහැ. ඒ වගේ පොදු දෙයක් කරන්නවත් ගොවි කාරක සභාවට බැරි නම් එයින් ඇති පලේ මොකක්දැයි ඔහු ප්‍රශ්න කළා.

ගොවිතැන් කටයුතු වලට ආණ්ඩුවෙන් නියම කරල තියෙන හදිසි ණය ගැන දන්නෙ නැති බව සීනිතම්බි මහතා කියා සිටිය. ඔහු කී හැටියට ඔහු ලබා ගන්නා ණය අස්වැන්න ලැබෙන කල් කරන්න ඕන වැඩවලට ප්‍රමාණවත් නැහැ.

වී මිළ වැඩි කිරීම ගොවිතැන් කටයුතුවලට හොඳ උදව්වක් උනත් ඒ එක්කම වෙන වෙන දේවල් වල මිළ ගණන් වැඩි හින්ද සාමාන්‍ය ගොවි මහතුන්ට නම් වී මිළ වැඩි කිරීම හුඟක් ලොකු සහනයක් නෙවෙයි කියලයි ඔහු අදහස් කරන්නෙ.

ඔහු කීවෙ හාල් සලාකය අඩු කිරීම දුප්පත් අයට ලොකු කරදරයක් බවයි. දැනට තියෙන මිළ ගණන් වල හැටියට ගොවිතැනින් ලබා ගන්නා දේ වියදමටත් මදි බව සීනිතම්බි මහතා අවසාන වශයෙන් කියා සිටියා.

× × ×

**වාලච්චේන, අන්තෝනි පිල්ලෙ පයස්** මහතා අවුරුදු 23 ක තරුණයෙක්. ඔහු ජ්‍යෙෂ්ඨ විභාගයෙන් වැඩ හතරකින් සමත් වෙලා තියෙනව. ඔහු කීවෙ ඔහුගේ තාත්තා අවුරුදු ගණනාවක සිටම ගොවි තැන් කරමින් ජීවිකාව කර ගෙන යන කෙනෙක් බවයි. අක්කර 5 ක් වී ගොවිතැන් කරන්න ඔහු තාත්තාට උදව් වෙන බව පයස් මහතා කියා සිටිය. මයියොක්කා, බඩ ඉරිඟු, ලූනු, මිරිස් ආදියත් ගෙවත්තෙ වවල තියෙන බව ඔහු කීව. පයස් මහතා ගොවිතැන් කටයුතු කරන්නෙ වාලච්චේන කඩදාසි කර්මාන්ත ශාලාවෙ රස්සාවක් කරන ගමන්මයි.

වී ගොවිතැන් කරන්න ඔඩ්ඩමාවඩු විවිධ සේවා සමුපකාර සමිතියෙන් ඔහු ණය ගන්නව. කලින් ගත්ත ණය තාම ආපහු ගෙවන්න බැරි උනේ පසුගිය කන්නය පාලු වුන හින්ද බව ඔහු කීව. යල කන්නෙට වැඩ කරන්න ඒ පළාතේ වතුර ලබා ගන්න බොහොම අමාරුයි.

ගොවි කාරක සභාව ගොවිතැන් කටයුතු ගැන මොනම සැලකිල්ලක් වත් දක්වන්නෙ නැති බවයි ඔහු කියා සිටියෙ. ඔහු කියන හැටියට කුඹුරුවල තියෙන ගොයම් කන්න නිතරම හරක් එනව. මේ බව ගොවි කාරක සභාවට දැන්නුවාම ඒ අය මේ කරදරය නතර කරන්න කිසිම වැඩ පිළිවෙලක් යෙදුවෙ නැති බව පයස් මහතා කීව.

ගොවිතැන් කටයුතු වලට ඔහු පෝර ගන්නෙ සමුපකාරෙන්. කුඹුරු හාන්න පිටස්තර අයගෙන් ට්‍රැක්ටර් කුලියට ගන්නව. බෙහෙත් ඉහින යන්ත්‍ර ද ඇති තරම් ඒ පළාතේ නැති හින්ද කුලියට ගන්න සිදු වන බව පයස් මහතා කීව.

ඔහු කීවේ ඉඩම් ඇති තැන්වලින් කුලියට හරි ඉඩම් ලබාගෙන තව තවත් ගොවිතැන් කරන්න කැමැත්තක් තිබුණත් ඒවාට කොයි මාර්ගයකින්වත් උදව්වක් ලැබෙන්නෙ නැති බවයි. ඉඩම් ඇති තරම් ලැබෙනව නම් කුලිය ගෙවල හරි ගොවිතැන් කරන්න පුළුවන්. ඒත් ඒ පළාතෙ වැඩ කරන්න පුළුවන් වෙන්නෙ එක කන්නයයි. අනෙක් කන්නෙට වතුර ලබා ගන්න අමාරුයි.

මෙච්චර කාලයක් මිරිස්, ලූනු, ආදිය වැව්වෙ ගෙදර පාවිච්චියට ගන්න බව ඔහු කීව. ඒ උනත් මේ සැරේ අක්කරයක් විතර එළවලු වගා කළේ විකුණන්නත් අදහස් කරගෙනයි. පයස් මහතා කීවෙ ගොවිතැන් කටයුතු ගැන තවම ඔහුට වැඩි පළපුරුද්දක් නැති බවයි. ගොවිතැනට ඇති ආසාව නිසාම ගොවිතැන් කරන්න පටන් ගත් බව ඔහු කියා සිටිය.

× × ×

**මොරක්කටන්චේන, සිට්ටන්ඩි ජනපදයේ, මුත්තු පුල්ලේ නල්ලතම්බි** මහතා අවුරුදු 55 ක් වයසයි. ඔහුට ළමයි තුන් දෙනෙක් ඉන්නව. ඔහුගේ ලොකු පුතා කුලී වැඩ කරන අතරම. තමාගේ ගොවිතැන් කටයුතුවලටත් උදව්වෙන බව ඔහු කීව. 1952 දී නල්ලතම්බි මහතාට

ආණ්ඩුවෙන් ඉඩම් අක්කර 5 ක් ලැබිල තියෙනව. ඒවායේ මහ කන්නයේ පමණක් වී වගා කරන්න පුළුවන්. වීත් එක්කම මයියොක්කා ආදියත් වගා කරන බව ඔහු කිව. යල කන්නයේ ඒ ඉඩම් වල වැඩියෙන් ගොවිතැන් කට යුතු කරන්න බැරි හින්ද වෙනත් තැන්වල කුලී වැඩ කරගෙන ජීවිකාව කරගෙන යන බව නල්ලතම්බි මහතා කියා සිටිය.

නල්ලතම්බි මහතා ගොවිතැන් කරන්න සමුපකාරයෙන් කලින් ණය ගත්තා. ඒ ණය ආපසු ගෙවන්න බැරි වුන හින්ද ණයට හිලව් කරන්න හාල් කූපන් සමුපකාරයට දෙන්න සිදුවූ බව ඔහු කියා සිටිය. ඔහුට ණය ගෙවන්නට බැරි වුනේ ඒ කාලයේ ඔහු අසනීපයෙන් සිටි නිසයි. නල්ලතම්බි මහතා ඊට පස්සෙ සමුප කාරෙන් ණය ගන්නට ගියේ නැත්තෙ ආයෙත් පාරක් ණය වෙන්නට බැරි වුනොත් කූපන් දෙන්නට වේයයි සිතාගෙනයි. එහෙම වුනොත් දරුමල්ලන්ට බඩගින්නේ ඉන්න සිදු වන බව ඔහු



ණය ගෙවන්න බැරි වුනොත් කූපන් දෙන්න වේ යැයි හිතාගෙන ණය නොගත් නල්ලතම්බි මහතා

කියා සිටිය. හදිසි වගා ණය ගැන තමන් කිසි වක් නොදන්නා බව නල්ලතම්බි මහතා කීව.

ඔහු ගොවි කාරක සභාව ගැන දන්නව. මොකක් හරි අමාරු ප්‍රශ්නයක් තියෙනව නම් ඒ ගොවි කාරක සභාවේ සභාපති මහත්තය හම්බ වෙන්න යන බව ඔහු කීව.

ඔහු කීවෙ හදිසි ණය මුදලක් කරදරයක් නැතිව දූන් ලැබෙනව නම් මිරිස්, ලූනු ආදිය ටිකක් වගා කර ගන්න පුළුවන් බවයි.

ගොවි හැඳුනුම් පත් ගැන ඔහු දන්නෙ නැහැ. ඔහු කීවෙ ණය ගන්න ගියාම කන්තෝරුවල නිලධාරි මහත්වරු ඔහුට පහත් විදියට සලකන බවයි.

X X X

**ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, තඹලගමුව තම්පල කාමම්,) ගල්මැටියාවේ අංක 91බී, එස්. ඒ. ඩී. සමරසිංහ** මහතා වයස අවුරුදු 43 ක ගොවි මහතෙක්. සමරසිංහ මහතාට ආණ්ඩුවෙන් ගොඩ ඉඩම් අක්කර 2 ක් ලැබිල තියෙනව. තවත් අක්කර 2 ක් ආණ්ඩුවට කුලී ගෙවල ඔහු වැඩ කරනව. මඩ ඉඩම් අක්කර 3 කුත් සමරසිංහ මහතාට ආණ්ඩුවෙන් ලැබිල තියෙනව.

මඩ ඉඩම් අක්කරයක් වැඩ කරන්න රු. 500/- ක් විතර වියදම් වෙන බව කී සමරසිංහ මහතා ට්‍රැක්ටර් වලින් එක අක්කරයක් හාන්න රු. 150/- ක් අය කරන බව පැවසුව. ඔහු ට්‍රැක්ටර් කුලියට ගන්නෙ ඒ පළාතේ පෞද්ගලික අයගෙන්. ඔහු කියන හැටියට කුඹුරු වැඩ කරන කාලෙට ට්‍රැක්ටර් කුලියට ගන්න හුඟක් කරදරයි.

ගොඩ මඩ ගොවිතැන් කටයුතු කරන්න සමරසිංහ මහතා තම්පලකාමම් විවිධ සේවා සමුප කාර සමිතියෙන් ණය මුදල්, පෝර, බේත් ද්‍රව්‍ය ලබා ගන්නව. ඔහු කිවුව හැටියට වී වපුරන්න දෙන ණය මුදල හුඟක් වෙලාවට ලැබෙන්නෙ වී වපුරල ඉවර වුනාටත් පස්සෙ. ණය ඉල්ලුම් පත් හුඟක් කලින්ම සමුපකාරයට බාරගත් බව කී සමරසිංහ මහතා සමහර කොටසකට

ඉක්මණටම ණය දුන්න බවත් ණය ගෙවන්න බැරුව හිටිය සමහර අයට අලුතෙන් ණය දීම පරක්කු කළ බවත් කියා සිටිය. ඔහු කීවෙ පෝරත් ඕන කරන වෙලාවට කවදාවත් හම්බ වෙන්නෙ නැති බවයි. හුඟක් වෙලාවට පෝර ලැබෙන්නෙත් තමන්ට ඕන කරන වෙලාවට නෙවෙයි. එතකොට සමහර අය ඒ පෝර අඩු මිළකට වෙනත් අයට විකුණනව. තම්පල කාමම් විවිධ සේවා සමුපකාර සමිතියෙන් ණය මුදලක් දෙන කොටම පෝර බිලක් ද දෙන බවත් පෝර ගත්තත් නොගත්තත් ඒ බිළ අත්සන් කරන්න ඕනෑ බවත් සමරසිංහ මහතා කියා සිටිය. ඔහු කියපු හැටියට පෝර බිල ලියන්නේ ණය මුදලෙන් කොටසකටයි. ඔහු කීවෙ මෙ විදියට ලියපුවහම පෝර නොගත්තත් ගත්තායයි කියන්න පුළුවන් බවයි. මේ කරුණු ඔප්පු කරන්න සමරසිංහ මහතා තම්පලකාමම් විවිධ සේවා සමුපකාරයෙන් ලැබුන බිලක් ද පෙන්නුව. සමරසිංහ මහතා කියන්නේ ණය මුදලක් දෙන කොට එය මුදලින්ම ගොවි මහත්වරුන්ට දෙනව නම් එය හුඟක් හොඳ බවයි.

සමරසිංහ මහතා ගොවි කාරක සභාව ගැන හුඟක් දුරට කලකිරිල ඉන්න බව පැවසුව. ඔහු කලින් ගොවි කාරක සභාවේ කටයුතු කළා. දැන් නම් සාමාජිකයෙකු නොවෙයි. ඔහු කීවෙ ඇල වේලි සුද්ද පවිත්‍ර කරන්න ගොවි කාරක සභාව කිසිම උනන්දුවක් දක්වන්නෙ නැති බවයි. ඒ නිසාම මේ වගේ දේවල් ලොකු තැන්වලට කියා හිටින්න සිද්ද වුන බව සමරසිංහ මහතා කීව. ගොවි කාරක සභාවට තෙල් ඉහින යන්ත්‍රයක් තියෙනව. ඒ වුනත් තෙල් ඉහින යන්ත්‍ර එකක් විතරක් තිබුනට වැඩ කරන ඔක්කොටම එක වෙලාවට ලබා ගන්න බැහැ.

සමරසිංහ මහතා අක්කර 2 ක විතර බඩ ඉරිඟු වවල තියෙනව. මේ බඩ ඉහුරු වගාවට වල් ඌරන්ගෙනුත්, ගිරවුන්ගෙනුත් හුඟක් අලාභ හානි සිද්ද වෙන බව ඔහු පැවසුව. බඩ ඉරිඟු සමුපකාරයටු විකුණන්නයි ඔහුගේ අදහස. හුඟක් කලක ඉඳන් තුවක්කුවත් ඉල්ලුවත් තවම එය ලැබුනෙ නැහැයි සමරසිංහ මහතා කියා සිටිය. ඒ පළාතේ ගොවිතැන් කරල තියෙන දේවල් හොරකම් කරන අයත් දැන් දැන් වැඩි වේගන යන බව සමරසිංහ මහතාගේ අදහසයි.

බිත්තර වීත්, පැල වර්ගත් ඔහු ලබා ගන්නෙ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන්. ඒවා ලබා ගන්න කිසිම කරදරයක් නැහැ.

සමුපකාරයට වී විකුණන කොට, වී දමන ගෝනියක බර හැටියට රාත්තල් හතරක් අඩු කර ගන්නා බව සමරසිංහ මහතා කිව්ව. ඇත්ත වශයෙන්ම ගෝනියේ බර රාත්තල් 4 ද ඊට අඩු ද කියල තමන්ට දැන ගන්න හැටියක් නැති බවයි ඔහු වැඩිමනත් කියා හිටියෙ.

සමරසිංහ මහතා ගොවිතැන් වැඩ කරන්න වතුර ලබා ගන්නෙ ගල්මැටියාව වැවෙන්. ඔහු කීවෙ කලට වේලාවට ගොවිතැන් කරන්න වතුර ලබා දෙනව නම්, ඒ වගේම පෝර ආදී යත් ඕනෑ කරන වෙලාවට ලබා දෙනව නම් ඔහුගෙත්, ළමයින්ගෙත් හාල් සලාකය කැපුවත් කමක් නැති බවයි. වී මිළ වැඩි කිරීම ගොවි මහතුන්ට කරපු ලොකු උදව්වක් බව සමරසිංහ මහතා කියා හිටිය.

සමරසිංහ මහතා තඹලාගමුව ගම් සභාවේ ද සභික මහත්මයෙක්. දේශපාලන අදිකාරය ගැන කතා කරමින් ඔහු කිවෙ ඒ පළාතේ ගොවිතැන් කටයුතු කරන අයට දේශපාලන අදිකාරය ගැන හොඳින් දැන ගන්න තවම කාලයක් ලැබුනෙ නැති බවයි.

X X X

**මොල්ලිපතාන, තිස්සපුර අංක 154/8 හි එල්. ඒ. එස්. සමරතුංග** මහතා අවුරුදු 29 ක තරුණයෙක්. 1962 දී ඔහු ජ්‍යෙෂ්ඨයෙන් සමත් උනා. මේච්චර කාලයක් ගොවිතැන හැරෙන්නට වෙන රස්සාවක් ඔහු කර නැහැ. පිළිවෙලකට ගොවිතැන් කරන්න සමරතුංග මහතා පටන් ගත්තෙ අවුරුදු තුනක සිටයි. ඔහුට අයිති ඉඩ කඩම් නැහැ. ඔහු ගොවිතැන් කරන්නෙ ඔහුගෙ තාත්තට අයිති ගොඩ මඩ ඉඩම් වලයි. ගොඩ ඉඩම් අක්කරයකුත් මඩ ඉඩම් අක්කර තුනකුත් ගොවිතැන් කරන සමරතුංග මහතා ඒ පළාතේ ''මහසෙන් තරුණ ගොවි සමාජයේ'' හොඳ සාමාජිකයෙක්.



ඉදල් ඉරිඟු, සෝයා බෝංචි, මිරිස්, බතල වගේ හුහක් බෝග ජාති වවල තියන සරු ගොවිපලක් අයිති සමරතුංග මහතා

සමරතුංග මහතාගේ ගොවිපල හරිම ලස්ස නයි. අක්කරයක් විතර ප්‍රමාණයේ සමරතුංග මහතා මයියොක්කා, බතල, බඩ ඉරිඟු, ඉදල් ඉරිඟු, සෝයා බෝංචි, කව්පි, මිරිස් සහ එළ වලුත් වවල තියෙනව. මේවා හොඳ සරුවට වැවිල තිබුනේ සමරතුංග මහතා කියන හැටි යට කෘෂිකර්ම උපදේශක වරුන්ගෙන් උප දෙස් අරගෙන ඒ විදියට ගොවිතැන් කරන හින්දයි.

කුඹුරු වපුරන්න සමරතුංග මහතා වතුර ගන්නේ කන්තලේ වැවෙන්. ඔහු කීවෙ මඩ ඉඩම් වැඩ කරන්න බලාපොරොත්තු වෙන්නෙ යල් කන්නෙට විතරක් බවයි. යල කන්නෙදි වැවේ වතුර හුහක් හරිය සීනි කර්මාන්ත ශාලා වට ලබා දෙන හින්ද ඒ කන්නෙට කුඹුරු වැඩ කරන්නෙ නැති බව සමරතුංග මහතා කීව.

ගොවිතැන් කටයුතුවලට වියදම් කරන්න ඔහු ණය ගන්නෙ තිස්සපුර විවිධ සේවා සමුප කාර සංගමයෙන් ඔහු මේ පාර ණය අරගෙන නැහැ. පෝර ආදිය ලබාගන්නෙත් සමුප කාරෙන්. සමරතුංග මහතා කීවේ මේ පාර තිස්සපුර විවිධ සේවා සමුපකාරයෙන් වෙල පහින්ම පෝර හම්බ උන බවයි. ඔහු කියන්නේ සමහර විට ගොවිතැන් කටයුතුවලට ආණ්ඩු වත් උනන්දුවක් දක්වන හින්ද මේ වතාවෙ සමුපකාරයෙනුත් කරදරයක් නැතිව පෝර ටික ලැබුන බවයි.

සමරතුංග මහතා සමුපකාරයට වී විකුණනව. ඔහු කීවෙ වී විකුණන්න ගියාම ගෝනියක බර හැටියට රාත්තල් 4 ක් අඩු කරන බවයි. ඒ වගේමවී පළමුවැනි වර්ගය, දෙවැනි වර්ගය කියල එක එක වර්ග වලට බෙදෙන්නේ සමුපකාර කළමනාකාර මහතයි. ඔහු වර්ග කරන විදියට වී වලට සල්ලි හම්බ වෙන බව සමරතුංග මහතා කීව.

ඔහුගේ එලවලු ඔහු විකුණන්නෙ පෞද් ගලික අයටයි. පෞද්ගලික වෙළෙන්දෝ ඒව ගන්න ඔහුගේ ගොවිපලට එනව.

ගොවි කාරක සභාව වෙලාවට අක්කර බද්ද නම් අය කරන බව සමරතුංග මහතා කීව. ගොවි කාරක සභාවට ට්‍රැක්ටරයක් නැහැ. ඒ නිසා කුඹුරු හාන්න පෞද්ගලික අයගෙන් ට්‍රැක්ටර් ලබා ගන්නව. සමරතුංග මහතා කීවේ සමුපකාරයට වී දෙනවට වඩා, වී මිළට ගැනීම ගොවි කාරක සභාවට බාර දෙනව නම් එය හුහක් හොඳ බවයි. ඔහු කියපු හැටියට ගොවි කාරක සභාවේ ඉන්නේ ඒ පළාතේම අය හින්ද සමුපකාරයට වැඩිය හොඳට වී ලබා ගන්න ඒ අයට පුළුවන් බවයි.

යල කන්නෙදි වතුර ලබා ගන්න බැරිකම ගොවිතැන් කටයුතුවලට ලොකු කරදරයක් බව සමරතුංග මහතා කියා සිටිය. ඒ කන්නෙට අඩු ගණනේ ගොඩ ගොවිතැන් කරන්නවත් ණයත් ලබා ගන්න වැඩ පිළිවෙලක් යොදනව නම් ගොවිතැන් කරන අයට ඒක ලොකු උදව්වක් යැයි සමරතුංග මහතා හිතනව.

ගොවිතැන් කිරීමට පහසුකම් තියෙනව නම්, වැඩියත්ම කන්න දෙක වැඩ කරන්න පුළුවන් නම් හාල් සලාකය සම්පූර්ණයෙන්ම

අත්හිටෙවුවත් ඒක කරදරයක් නොවන බව සමරතුංග මහතා කියා සිටිය. ඔහු කීවේ ''මහසෙන් ගොවි සමාජයේ'' සාමාජික සාමාජිකාවෝ හැම කෙනෙක්ම දන් ඉස්සරටත් වඩා ලොකු උනන්දුවකින් ගමේ ගොවිතැන් කටයුතුවලට උදව් කරන බවයි.

ඒ පළාතේ ගොවි මහත්වරුන්ට තියෙන තවත් කරදරයක් ගැන කතාකළ සමරතුංග මහතා නිදැල්ලේ ඉන්න හරක් ගොවිතැන් වලට අලාභ හානි කරන බව සඳහන් කළා. මේ ගැන ගොවි කාරක සභාවට කිවුවට පස්සෙ ගොවි කාරක සභාව හරක් අයිති කාරයන්ට මෙය නතර කරන්න කියල තියෙනව. ඒ වුනත් හැමදම රට 100 ක් විතර හරක් ඇවිත් ගොවිපලවල් පාලු කරන බව සමරතුංග මහතා කියා සිටිය.

ඔහු කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානයේ පවත්වන හැම පන්තියකටම යනව. ඔහු කියන්නේ අඩු ගණනේ මාසෙකට සැරයක්වත් දිගටම ඒ පන්ති පවත්වනව නම් ගොවිතැන් කටයුතු වලට හොඳ හොඳ උපදෙස් ලබාගන්න පුළුවන් බවයි.

× × ×

**තම්පලකාමම්, පඩ්ඩිවේඩු, එස්. කේ. සිවසුබ්‍රමණියම්** මහතා යමක් කමක් ඉගෙන ගත්ත ගොවි මහත්මයෙක්. ඔහු කතා කළේ ඉංග්‍රීසියෙන්. ඒ පළාතේ ගොවිකාරක සභා දෙකකම කටයුතු කරන සිවසුබ්‍රමණියම් මහතා පළාතේ ගොවිතැන් වලදී සිදුවන කරදර ගැන හොඳ දැනුමක් ඇතුව කතා කළා. ඔහුට මඩ ඉඩම් අක්කර 12 ක් විතර පරවේණි උරුමයෙන් ලැබිල තියෙනව. ඔහු මේව වැඩ කරවන්නේ කුලිකරුවෝ යොදවලයි.

මේ ඉඩම් හුඟක් මඩ සහිත ඉඩම් නින්ද ට්‍රැක්ටර් යොදවන්න බැරි බව සිවසුබ්‍රමණියම් මහතා කිව්ව. ඒ නින්ද කුඹුරු හාන්න මී හරක් යොදා ගන්නව. සිවසුබ්‍රමණියම් මහතා කීවේ මී හරකුන්ගෙන් අක්කරයක් හාන්න රු. 120/- ක් අය කරන බවයි. ඔහුට අයිති හරක් 10 ක් විතර තිබියත් ඔහුගේ වැඩ කරන්න වෙනත් අයගෙන් කුලියට හරක් ලබා ගන්නා බව ඔහු කියා සිටිය.

පිච්චවලි, කොයිලාතවලි ගොවි කාරක සභා දෙකේම සභාපති හැටියට වැඩ කරන සිවසුබ්‍රමණියම් මහතා කීවේ අක්කර බද්ද එක්කහු කරන එක දන් ටිකක් කරදර බවයි. ඒ එක ගොවි කාරක සභාවකට බෙහෙත් ඉහින යන්ත්‍රයක් තියෙනව. ඒ ප්‍රදේශයේ වාරිමාර්ග ඒජන්තට පඩි ගෙවන්නෙත් ගොවි කාරක සභාව අක්කර බද්ද හැටියට එක්කහු කරන සල්ලිවලින්.

ඔහු ගොවිතැන් වැඩ කරන්න ණය ගන්නව. ණය ඉල්ලුම් පත් දෙන්නේ තම්පලකාමම් විවිධ සේවා සමුපකාර සමිතියටයි. ඔහු කීවේ එම සමිතියෙන් ණය ඉල්ලුම් පත්‍ර මහ සංගම යට යවල ඒවා අනුමත වෙලා සල්ලි හම්බ වෙන කොට හුඟක් කල් ගතවෙන බවයි. ඒ සමුපකාර සමිතියෙන් කෘමි නාශක ද්‍රව්‍ය නම් ඕන තරම් තියෙනව. සාමාන්‍යයෙන් සමුපකාර යේ වැඩ සතුටුදයක බව ඔහු පැවසුව.

වී විකුණන්න නම් කිසිම කරදරයක් ඔහුට නැහැ. තම්පලකාමම් විවිධ සේවා සමුපකාර සමිතිය රාත්තල් 112 ක් දන වී ගෝනියකට ගෝනි බර හැටියට අත්හරින්නේ රාත්තල් 2 1/2 යි. ඔහු කීවේ ඒ ප්‍රමාණය සාධාරණ බවයි. සිවසුබ්‍රමණියම් මහතා දේශපාලන අදිකාරය ගැන සැලකිල්ලක් දක්වන බව පැවසුව. ඒ වගේ වැඩ පිළිවෙලකින් ගොවිතැන් කරන අයත් නිලධාරි මහත්වරුත් වඩාත් කිට්ටුවන බව ඔහුගේ අදහසයි.

වී ගොවිතැන් කරන්න වතුර ලබා ගන්නේ වැවෙන් නින්ද වතුර ගැන වැඩි කරදරයක් නැහැ.

හාල් සලාකය අඩු කිරීම නම් හුඟක් කනගාටුදයක දෙයක් බව ඔහු කීව. ඒ පළාතේ රු. 5/- කට වත් හාල් සේරුවක් ගන්න නොමැති බව ඔහු සඳහන් කළා. පෞද්ගලික අය වී බුසලකට රු. 50/- ක් වුනත් ගෙවන්න සූදනම් බව ඔහුගේ අදහසයි.

ඒ ප්‍රදේශයේ හැම කෙනෙක්ම මොනවා හෝ ගොවිතැන් කරන්න උනන්දුවක් දක්

වනව. ඒ උනත් ගොඩ ඉඩම් තියෙන්නෙ බොහොම ටිකයි. පරම්පරා ගණනාවක ඉඳලම වී ගොවිතැන් කරන හින්ද තමන්ගෙ වතුවල වෙන වෙන දේවල් වගා කරන්න ගොවි මහත්වරු වැඩි උනන්දුවක් දක්වන්නෙ නැහැ. සමහර වෙලාවට වී වගා කරන්නේ නැති කන්නවල හුඟක් අඩුවෙන් මුංඇට කාරිය වපුරනව.

තම්පලකාමම් වෙල් යායට වතුර එන්නෙ හැතැප්ම 13 ක් විතර ඈත හිටයි. ඒ අතර තියෙන ජනපදවල ඉන්න අය තැන් තැන්වලින් වතුර ලබා ගන්නා හින්ද කෙළවරේම ඉන්න ගොවි මහත්වරුන්ට වතුර ගැනීම ටිකක් කරදර බව සිවසුබ්‍රමණියම් මහතා ප්‍රකාශ කළා.

× × ×

**තම්පලකාමම්, පඩ්ඩිවේඩු, සෝමසුන්දරන් කුරුක්කාල්** අවුරුදු 60 ක් වයස හින්දු පූජක වරයෙක්. ඔහුගේ ප්‍රධාන ආදායම් මාර්ගය ගොවිතැනයි. ඔහුට පුතුන් 4 දෙනෙක්, එක දුවෙකුත් ඉන්නව. ඔහු කිවෙ 3 වැනි පුතා තමන්ගේ ගොවිතැන් කටයුතු වලට උදව් කරන බවයි.

ඔහුට අයිති ඉඩම් නැහැ. ඔහු ගොවිතැන් කරන්නේ වෙන්දේසියෙන් බදු ගත්ත පන්සලේ ඉඩම් වලයි; තවත් පෞද්ගලික අයගෙන් බදු ගත්ත ඉඩම් වලයි. මේ අවුරුද්දේ ඔහු අක්කර 9 ක් වී ගොවිතැන් කරල තියෙනව. මේවායින් අක්කර 3 කට තම්පලකාමම් විවිධ සේවා සමුපකාර සමිතියෙන් ණය අරගන්නා. සෝමසුන්දරන් මහතා කලින් ගත්තු ණය ගෙවල ඉවර වෙලා තිබුන හින්ද ආයෙත් පාරක් ණය ගන්න ඔහුට කරදරයක් වුනේ නැහැ.

ගොවි කාරක සභාව ගැන ඔහු කීවේ 70–71 අවුරුද්දටත්, 71–72 අවුරුදු වලටත් අක්කර බදු ගොවි කාරක සභාවට ගෙවුවත් තවම ඒකට කුවිතාන්සියක් තමන්ට ලැබුනේ නැති බවයි. ගෙවව සල්ලි වලට කුවිතාන්සියක් ලැබුනෙ නැති හින්ද ඊට පස්සෙ අක්කර බදු ගෙවුවෙත් නැතැයි සෝමසුන්දරන් මහතා කියා සිටිය. ඔහු කියන හැටියට ගොවි කාරක සභාව වාරි මාර්ග ඇලවල් පිරිසිදු කරන්නෙත් නැහැ. ඒ වගේම ගොවිපලවල් පාලු කරන දඩාවතේ යන හරක් ගැනවත් කිසිම වැඩ පිළිවෙලක් ගොවි කාරක සභාව මෙච්චර කලක් කරල නැහැ.

කුඹුරු හාන්න ඇති තරම් ට්‍රැක්ටර් ඒ පළාතේ නැති හින්ද මුලු කුඹුරු යායම හානකොට පෞද්ගලික අයගෙන් ට්‍රැක්ටර් ලබාගන්න හුඟක් කරදර බව සෝමසුන්දරන් මහතා කියා සිටිය. ඔහු කීවේ කුඹුරු වැඩ කරන්න පුළුවන් එක කන්නයක් විතරක් බවයි. ඔහු කියන හැටියට කන්න දෙකම වැඩ කරන්න පහසුකම් ලබා දෙන්න පුළුවන් නම් ඒ ප්‍රදේශයේ අයට ගොවිතැන් කරන්න එය ලොකු අනුබලයක්.

වී මිළ රු. 25 දක්වා වැඩි කළත් ගොවිතැන් කරන්නට යන වියදම ද වැඩි වී ඇති හින්ද එයින් ලොකු සහනයක් ලැබෙන්නෙ නැහැයි සෝමසුන්දරන් මහතා අවසාන වශයෙන් ප්‍රකාශ කළා.

× × ×

**යාපනය දිස්ත්‍රික්කයේ නයන්මාර්කඩ්ඩු, වෙම්මනි පාරෙ, රාමලිංගම් වේලුපිල්ලේ** මහතාගේ වයස අවුරුදු 65 යි. මලයාවේ බැංකු වක වැඩ කළ වේලුපිල්ලේ මහතා ලංකාවට ආවේ 1969 දී. එද ඉඳලම ඔහු ගොවිතැන් කරනව. වේලුප්පිල්ලේ මහතා ලාච්චම් 50 ක් (ලාච්චම් 24—අක්. 1) වී ගොවිතැන් කරනව. ගොවිතැන් කරන්න බිත්තර වී ඔහුම සොයා ගන්නව.

වේලුපිල්ලේ මහතා කුඹුරු හාන්න ට්‍රැක්ටර් කුලියට ගන්නේ පෞද්ගලික අයගෙන්. ඔහු කුඹුරු වැඩට ණය අරගන්නෙ නැහැ. ඔහු කිව්ව හැටියට කුඹුරු අක්කරයක් වැඩ කරන්න රු. 500/- ක් විතර වියදම් වෙනව. පසුගිය කන්නෙදි අකකරයකට වී බුසල් 45 ක් විතර ලැබුන බව ඔහු කියා සිටිය. ඔහු වී ගොවි තැන් කරන්නේ තමන්ගේත් පවුලේ අය ගෙත් යැපීමටයි. ඔහු වී විකුණන්නෙ නැහැ.

ඒ කුඹුරු යායේ අය ගොවිතැන් කරන්නේ වැස්ස ලැබෙන හැටියටයි. වෙම්මනිකුලම් වැව තියෙන්නේ ඒ ළඟමයි. වේලුපිල්ලේ

මහතා කියන හැටියට වැවෙන් කුඹුරට වතුර ගන්න විදියක් නැහැ. ඒ වුනත් කුඹු-රෙන් වතුර වැවට බස්සවන්න නම් පුළුවනි. තත්වය මෙහෙම හින්ද, කුඹුරු වැඩට වැවෙන් වතුර ගන්න බැරියයි ඔහු කිව්ව.

වේලුපිල්ලේ මහතා ඒ පළාතේ ගොවි කාරක සභාවේ සාමාජිකයෙක්. ඔහු කීවේ අක්කර බද්ද අය කරන්න ගොවිකාරක සභාව කටයුතු කරන බවයි. වේලුපිල්ලේ මහතා කියන හැටියට හොඳ අස්වැන්නක් ලැබුනහම කරදරයක් නැතුව අක්කර බද්දත් ලබාගන්න පුළුවන්. කලින් නම් ගොවි කාරක සභාවට පෝර එහෙම ලැබුනා. ඒ පෝර ගොවි මහත්වරුන්ට දීල ගොවි කාරක සභාවත් ගොවි මහත්වරුත් අතර සම්බන්ධතාවයක් ඇති කරගන්න පුළුවන් වුනා. මේ පාර නම් පෝර දෙන්නේ සමුපකාරයෙනුයි. ගොවි කාරක සභාවට හුඟක් අය පැමිණිලි කරන්නේ දඩාවතේ යන හරක් කුඹුරුවලට වැදිල ගොයම් කන එක ගැන බව වේලුපිල්ලේ මහතා කීව. ඔහු කීව හැටියට ගොයම් කැපු-වට පස්සෙ මුංඇට, උළුඳු ආදිය වවන්න පුළු වන්. ඒ වුනත් හරකුන්ගෙන් ඇති කරදර හින්ද ඒව වවන්න හැටියක් නැහැ. මේ ප්‍රශ්-නය ගැන ගොවි කාරක සභාවටත් මොනම දෙයක් වත් කරන්න බැරි බව ඔහු කීව. යාපනයේ වෙළඳ පොළ අවට හරක් රංචු පිටින් ඉන්න බවත්, හවස් වුනහම මේ හරක් රංචු කුඹුරුවලට කඩා වදින බවත් වේලු පිල්ලේ මහතා කියා සිටිය. ඒ ගම් පළාතේ හුඟක් දෙනෙකුට කුඹුරු නැහැ. ඒක හින්ද තියෙන අයට හරකුන් ගෙන් වන කරදරය ගැන අනෙක් අයගේ තැකීමක් නැති බව වේලුපිල්ලේ මහතා කියා සිටිය.

කුඹුරු වල ගොයම් පැහෙන්නටත් කලින් ඒ ගොයම් කපාගෙන යන හොරුන් ගැනද ඔහු කතා කළා. ඔහුගේ කුඹුරේ මැද්දෙන් පැහෙන කොටසක් ගොයම් හොරු කපාගෙන ගොස් තිබෙන හැටි පෙන්නූ වේලුපිල්ලේ මහතා කීවේ මේ හොරුන්ට විරුද්දව කට යුතු කරන්න ගොවි කාරක සභාව පොලිසි යට කීප වරක්ම දන්වා ඇති බවයි.

පෙරිය වෙම්මනිකුලම් වාරි මාර්ග ක්‍රමය තවම ඉවර වෙලා නැහැ. මේ වැඩ කටයුතු ඉක්මණට ඉවර කරන්නයි කියල ගොවි කාරක සභාව කීප සැරයක්ම වාරි මාර්ග දෙපාර්තමේන්තුවට දැන් වුවත් එයින් කිසිම පලක් වුනේ නැහැ.


× × ×

**අච්චුවේලි, කකිරිපේ, සන්නදි පාරේ, එන්. ඉන්ද්‍රකුමාර්** මහතා අවුරුදු 23 ක තරුණයෙක් ඔහු ජ්‍යෝෂ්ඨයෙන් සමත් වෙලා ඊට පස්සෙ. උසස් පෙල විභාගයෙනුත් සමත් වෙලා තියෙනව. පොඩි කාලේ හිටන්ම ගොවිතැන් කටයුතුවලට කැමැත්තක් දැක්වූ බව ඉන්ද්‍රකුමාර් මහතා කියා සිටිය. ඔහු ලාච්චම් 12 ක් වවල තියෙනව. අල, ලූනු, මිරිස් ඔහුගේ ගොවිපලේ දකින්න තිබුන. අල වවන්න බීජ ලබා ගන්නේ වලි නැගෙනහිර විවිධ සේවා සමුපකාර සමිති යෙන්. ඔහු කීවේ කලින් අල ලාච්චම් 4 ක් වැවුවත් මේ පාර බීජ අල ලබා ගන්න පුළුවන් උනේ ලාච්චම් දෙකකට විතරක් බවයි.

ගොවිතැන් කටයුතු කරන්න ඉන්ද්‍රකුමාර් මහතා සල්ලි ණයට ගන්නව. ඔහු සල්ලි ණයට ගන්නේ සමුපකාර ග්‍රාමීය බැංකුවෙන්. ඔහු කීවෙ ඕන කරන වෙලාවට නම් ණය ලබාගන්න ටිකක් කරදර බවයි. ඔහු ඔක්-කොම ණය ආපසු ගෙව්වා. මේ ණය ආපහු ගෙවන්නේ සල්ලිවලින්මයි. කලින් නම් ණය ලබාගත්තහම, ඒ ණය පියවන කොට එයින් කොටසකට තමන් වගා කරපු දේවලුත් ඔහු සමුපකාරයට දුන්න. ඒ වුනත් දැන් සමුප-කාරය අල, ලූනු එහෙම ගන්නේ ගණන අඩුවෙන් හින්ද ඔහු ඒව විකුණන්නෙ පෞද්-ගලික අයටයි. පෞද්ගලික අය සමුපකාරෙ මිලට වැඩිය මිලක් ගෙවනව. ඒ වගේම ඒ අය කෙළින්ම ගොවිපලටම එන හින්ද ඒ ද්‍රව්‍ය තැනින් තැන ගෙන යන්නත් කරදර නැහැ. සමහර විට සමුපකාරයෙන් නියම කරන මිලට සමුපකාරයට ලැබෙන්නෙ තත්වයෙන් බාල ද්‍රව්‍යයයි. හොඳ වර්ගයේ අල හුඟක් වැඩි ගණනකට පෞද්ගලික අයට විකුණන්න පුළුවන්.

ඔහුගේ කුඹුරු වැඩ වලට ඔහු ට්‍රැක්ටර් ලබා ගන්නේ පෞද්ගලික අගයෙන්. ඒ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතියට

ට්‍රැක්ටර් එකක් වත් නැහැ. සමහර වෙලාවලට ට්‍රැක්ටර් ලබාගන්න එකත් ලොකු කරදර- යක්. ඒක හින්ද ඔහු උදැල්ලෙන් වැඩ කරනව. ලංකාවේ හදල තියෙන උදැල්ලෙන් තද පොලවට කෙටුවහම ඒ උදැල්ලේ කෙළවර කැඩෙන බව ඉන්ද්‍රකුමාර් මහතා පැවසුව.



තද පොළවට වැදුනහම උදැල්ල කෙළවර කැඩෙනවා. ගොවිතැන් කටයුතු වලට ඇති බාධාවක් විස්තර කරයි.

ගොවිතැන් කටයුතු කරන්න ඔහු වතුර ගන්නෙ ගොවිපලේම තියෙන ළිඳකින් පොම්ප කරලයි. අවුරුදු පහකට විතර ඉස්සර වෙලා ගොවිජන සේවා කොමසාරිස් කාර්‍යාලයෙන් වතුර පොම්පයක් ගත්තා. ඒත් දැන් ඒක කැඩිල. අලුත්වැඩියා කරන්න ඕන කරන කොටස් ලබාගන්න කරදර හින්ද එය දැන් පැත්තකට දාල තියෙන බව ඉන්ද්‍රකුමාර් මහතා කීව. ඔහුගේ ළිඳට උඩින් යන්ත්‍රයක් සවිකරල තියෙනව. හරකුන් බැඳල හරකුන් ලවා ඒ යන්ත්‍රය, වටේ කරකවා වතුර ලබාගන්න පුළුවන් බව ඔහු කීව්. ඒ වුනත් එයත් දැන් මලකඩ කාල කැඩිල තියෙන හින්ද පනිට්ටුවකින් වතුර ඇදල ගොවිපලට වතුර වත්කරනව.

ඔහුගේ ගොවිපලේ බෝග වගා කරන්නේ කන්නෙන් කන්නෙට මාරුවෙන් මාරුවටයි. ජනවාරි මාසයේ අල, මිරිස්, ලූනු, තුනම වවනව. ඊට පස්සෙ මැයි මාසයේ දී වවන්නේ ලූනු විතරයි. ජුලි මාසයේ ආයෙත් ලූනු වවනව. ඔහු කීවේ මේ පාර තුන් සැරයක්ම ලූනු වැව්වේ ලූනු ගණන් ටිකක් වැඩි හින්ද බවයි. සැප්තැම්බර් ඔක්තෝබර් මාස වල සාමාන්‍යයෙන් ඒ ඉඩම් වල මොකුත් වගා කරන්නේ නැහැ. ඒ වුනත් ඉන්ද්‍රකුමාර් මහතා ඒ මාසවලත් කුරක්කන් මුංඇට ආදිය වවනව.

ගොවි කාරක සභාවක් ඒ පළාතේ තියෙනව. එය කටයුතු කරන්නේ වී වැවීම ගැන විතරයි. ගොඩ ඉඩම් ගැන ඒ අය උනන්දුවක් දක්වන්නේ නැහැ.

ඒ පළාතේ තරුණ අය අතරේ ගොවිතැන් කටයුතු කරන්න දැන් නම් සෑහෙන උනන්දුවක් තියෙන බව ඉන්ද්‍රකුමාර් මහතා කීව. මීට නිදර්ශනයක් හැටියට ඔහු කීවේ කලින් අවුරුද්දකට දෙසැරයක් ලූනු වැව්වත් දැන් හැම කෙනෙක්ම වාගේ තුන් සැරයක් ලූනු වවන බවයි.

ඔහුට කුඹුරු නැහැ. ඒක හින්ද හාල් සලාකය අඩු කිරීම හරිම හරදරයක් බව ඉන්ද්‍රකුමාර් මහතා කීව. ඔහු කීවේ කාට උනත් හාල් නිකම්ම දෙන්නේ නැතුව රුපියල් 2/– කට විතර හාල් සේරුවක් ගන්නට පුළුවන් වෙන විදියට වැඩ පිළිවෙලක් යොදනව නම් එය හුඟක් හොඳ බවයි.

මේ සුළු ඉඩම් ප්‍රමාණයෙන් වැඩි ආදායමක් ලබන්න බැරි බවත් මේ ගොවිතැන් කටයුතු ගැන වැඩි විශ්වාසයක් තියන්න බැරි බවත් ඉන්ද්‍රකුමාර් මහතා පැවසුව. ඔහු කීවේ ආණ්ඩුවේ රස්සාවක් හම්බුවෙනව නම් මීට වඩා හොඳයි, කියලයි.

× × ×

**අළුවුවෙලි දකුණ, ඉස්පිරිතාල මාවතේ, සින්න දෙරේ පත්මනාදන්** මහතා දරුවන් 8 දෙනෙකුගේ පියෙක්. ඔහු ලාළුවුම් 10 ක් විතර

අල, ලූනු, මිරිස් වවල තියෙනව. ඔහුගේ ගොවිපලට අපි ඇතුල් වුනේ සපත්තු සෙරෙප්පු එහෙම් ගලවලයි. ගොවිපලකට ඇතුල් වෙන කොට එහෙම කිරීම යාපනයේ චාරිත්‍රයක්. මේ ඉඩම්වලින් වැඩි කොටසක් පත්මදානන් මහතාට අයිතියි. අනෙක් කොටස් ඔහු වෙනත් කෙනෙකුගෙන් බදු අරගෙන වැඩ කරනව.

ලාච්චම් 10 ක් වැඩ කරන්න රු. 3,000/-ක් විතර වියදම් වෙන බව පත්මනාදන්මහතා කීවව. හුඟක්ම සල්ලි වියදම් වෙන්නේ ගොම පෝර වලටයි. එක ගොම පෝර ලොරියක් වවුනියාවේ ඉඳල ගෙන්න ගන්න රු. 500/- ක් වියදම් වෙන බව පත්මනාදන් මහතා කීව.

පත්මනාදන් මහතා ගොවිතැන් කටයුතු කරන්න අච්චුවේලි විවිධ සේවා සමුපකාර සමිතියේ ග්‍රාමීය බැංකුවෙන් ණය ගන්නව. හුඟක් කල් ඉඳලම ණය අරගෙන පුරුදු බවත් කලට වේලාවට ආපසු ගෙවන හින්ද ණය ලබා ගන්න කරදරයක් නැති බවත් ඔහු ප්‍රකාශ කළා. ණය ගන්න කොට ඇප කරුවෝ දෙන්නෙක් ණය ඉල්ලුම් පත්‍රය සහතික කරන එක පමණයි ඕන කරන්නේ. අල වවන්න ඔහු බීජ ලබාගන්නේ විවිධ සේවා සමුපකාර සංගමයෙන්. පත්මනාදන් මහතා කීවේ මේ සැරේ ලොකුම කරදරයක් වුනේ බීජ අල ලබාගන්න එක බවයි. එක බීජ අල පෙට්ටියක සහතික මිළ රු. 130/- යි. ඔහුගේ වගාවට බීජ අල පෙට්ටි 7 ක් ඕන කරනව. ඒ වුනත් සමුපකාරයෙන් ඔහුට ලැබුනේ 4 ක් විතරයි. ඉතින් අනෙක් බීජ අල පෙට්ටි 3 පිට අයගෙන් එකක් රු. 250/- ගණනේ ගන්න සිදුවන බව පත්මනාදන් මහතා කීව.

ඔහුගේ ගොවිපල පිළියෙල කරන්න ඔහු රෝද දෙකේ ට්‍රැක්ටරයක් කුලියට ගන්නව. සමුපකාර සංගමයටත් ගොවි කාරක සභාවටත් ට්‍රැක්ටරයක් නැති හින්ද, එය කුලියට ගන්නේ පෞද්ගලික අයගෙන්. අච්චුවේලි-පත්තමේනි ගොවි කාරක සභාවේ භාණ්ඩාගාරික හැටියටත් පත්මනාදන් මහතා කටයුතු කරනව. ඔහු කීවේ ගොවි කාරක සභාවේ සල්ලි වලින් රු. 5,000 ක් වියදම් කරල රෝද දෙකේ ට්‍රැක්ටරයක් ගන්න උත්සාහ කලත් ඒ විදියේ ට්‍රැක්ටර් නොතිබුන හින්ද ලබා ගන්න අමාරු වුන බවයි. ගොවි කාරක සභාව ඒ පළාතේ හුඟක් වැඩ කටයුතු කරල තියෙන බව පත්මනාදන් මහතා කීව.

පසුගිය නොවැම්බර් මාසේ දී අල වගාවක් දැම්ම පත්මනාදන් මහතා අප්‍රියෙල් මාසයේදී ලූනුත් ජූනි මාසයේ දී බීට්රූට් අලත් වවන්න අදහස් කරනව. ඔහු කීවේ ජූනි මාසෙන් පස්සෙ, ලැබුනොත් කුරක්කන් වපුරනවා, එහෙම නැත්නම් ඊළඟ කන්නය එන තෙක් ඉඩම් නිකම්ම තියෙන්න හරිනව කියලයි.

දරුවන් 8 දෙනෙකුගේ තාත්ත කෙනෙක් හැටියට කල්පනා කරන කොට නම් හාල් සලාකය අඩු කිරීම තමන්ට ලොකු ප්‍රශ්නයක් බව පත්මනාදන් මහතා කීව. ඒ උනත් ගෙදර දොරේ යැපීමට වී ලාච්චම් 30ක් විතර ඔහු වැඩ කරන හින්ද යන්තමින් අවුරුද්ද කන්න හාල් ටිකක් ලැබෙන බව ඔහු වැඩිමනත් කියා සිටිය. ඒ පළාතේ ගොවි කාරක සභා ප්‍රදේශයට අයත් වෙන කුඹුරු යායට අක්කර 321 ක් විතර තියෙනව. ඒ ඔක්කොටම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් බිත්තර වී ලැබුනේ බුසල් 14 යි. ඔහුට ලැබුනේ එක බුසලයි. එක හින්ද පිටින් බිත්තර වී ගන්න සිදු වුන බව පත්මනාදන් මහතා කියා සිටිය.

ඔහු මිරිස්, ලූනු, අල ආදිය විකුණන්නෙ පිට අයටයි. විවිධ සේවා සමුපකාර සමිතියෙන් අල සල්ලි වලට ගන්නේ රාත්තලක් සත 45 ගණනේ. එහෙම ගන්නෙත් හොඳම අලයි. කැපුණු අලවලට ඒ අය සල්ලි දෙන්නේ නැහැ. ඒ වුනත් පිට අය සමහර වෙලාවට ඒ ගොල්ලන්ම වාහනවලින් ගොවිපලට ඇවිල්ල රාත්තලකට සත-/70, -/80 ගණනේ, සමහර වෙලාවට හොඳ අල රාත්තලකට රුපියල ගණනේ සල්ලි ගෙවල අරන් යන බව පත්මනාදන් මහතා කීව. කලින් වතාවේදී ඔහු කොළඹින් ආපු වෙළන්දන්ට මිරිස් වික්කෙ රාත්තල රු. 8.50 ගණනේ. ඒ කාලයේ සමුපකාර සමිතිය මිරිස් ගත්තේ රාත්තල රු. 5-50 ගණනේ. දැන් නම් සමුපකාරය කොහොමටවත් මිරිස් ගන්නේ නැති බව පත්මනාදන් මහතා පැවසුව.

කන්න බොන්න හොයා ගන්න එක දැන් ටිකක් කරදර හින්ද වැඩි වැඩියෙන් මොන මොනව හරි වවන්න ඒ පළාතෙ කවුරු

කවුරුත් උනන්දු වෙන බව පත්මනාදන් මහතා අන්තිමට කියා සිටිය.

× × ×

**කොන්ඩාවිල් නැගෙනහිර, කේ. වයිරවනාදන්** මහතා වයස අවුරුදු 29 ක අවිවාහක තරුණයෙක්. ඔහු ගොඩ ඉඩම් අක්කර 2 ක් වගා කරනව. අවුරුදු 12 ක සිටම ගොවිතැන් කටයුතු කරන වයිරවනාදන් මහතා මේ සුලු කාලය තුලම, අල, මිරිස් ආදිය වවල ටිකක් අතමිට සරු කර ගත්ත කෙනෙක්.

හොඳින් ගොවිතැන් කටයුතු කරන කොට ටිකක් සල්ලි යොදවල එහෙම කරන්න ඕන හින්ද සාමාන්‍යයෙන් අක්කරයක් වගා කරන්න රු. 6,500/- ක් විතර වියදම් වෙන බව වයිරවනාදන් මහතා කිව. අල වගා කරන කොට නම් හුඟක් සල්ලි වියදම් වෙන්නේ බීජ අල ලබා ගන්නටයි. ඕන කරන තරම් බීජ සමුපකාරයෙන් නොලැබෙන එක ලොකුම අවහිරයක් බව වයිරවනාදන් මහතා පැවසුව. ඔහු කිවෙ අක්කරයක් වගා කරන්න බීජ අලවලට විතරක් රුපියල් 2,200/- ක් වියදම වෙච්ච බවයි.

මේ විදියට ගොවිතැන් කටයුතුවලට සල්ලි හුඟක් වියදම් වුනත් තිරුනෙල්වේලි විවිධ සේවා සමුපකාර සමිතියෙන් ඔහුට ණය ලැබුනේ රු. 640/ ක් විතරයි. ඒක උනේ මෙහෙමයි. ඔහු අක්කර 2 ක් අල වගා කළත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් බීජ අල ලැබුනේ අක්කර 1/4 ට විතරයි. ඉතින් කෘෂි කර්ම දෙපාර්තමේන්තුව ණය නිර්දේශ කළේ ඒ අය බීජ අල ලබා දුන්න අක්කර කාලට විතරයි. ඒ හින්ද සමුපකාරෙන් ණය ලැබුනෙත් ටිකයි; පිටින් බීජ අල ලබා ගන්නත් හුඟක් වියදම් කරන්න සිද්ද උනා. මේ ණය මුදල කොහොම වත් මදි හින්ද ඔහු කලින් නම් යාළුවන්ගෙන් නෑදෑයින්ගෙන් කාරිය සැරෙන් සැරේ ණය ගත්ත. ඒ වුනත් දැන් ටිකක් අත මිට තියෙන හින්ද ගොවිතැන් කටයුතු කරන්න වයිරවනාදන් මහතාට වැඩි කරදරයක් නැහැ. අක්කරයකට රු. 5,000/ ක විතර ලාබයක් ඔහුට ලැබෙන බව ඔහු කිව.

ඔහු අල විකුණන්නේ පෞද්ගලික අයටයි. වයිරවනාදන් මහතා කිවේ පෞද්ගලික අය හුඟක් වෙලාවට අල භාරන්නත් ඉස්සර වෙලා ගොවිපලටම ඇවිත් මුලු වගාවටම සෑහෙන ගණනක් දෙන බවයි. ගොවියා කැමති නම් ඒ අය කුලිය යොදවල අල භාර ගෙන ඒ අයගේ වාහන වලින් අරගෙන යනව. මේ විදියට සමහර වෙලාවට ගොවි පලවල් 440 ක 500ක වගාව පෞද්ගලික අය අරගෙන යන බව වයිරවනාදන් මහතා කියා සිටිය. විවිධ සේවා සමුපකාරයට තමන්ගේ ද්‍රව්‍ය විකුණන්න යාම හුඟක් කරදරයි. වයිරවනාදන් මහතා කියන හැටියට හුඟක් වෙලාවට ගොවිතැන් කරන කෙනාම කුලිය දීල ඒවා සමුපකාරයට ගෙනියන්න ඕන. එතෙන්දී සමහර වෙලාවට තුවාල උන අල, කුඩා අල කියල ඒව අයින් කරනව. ඒත් පෞද්ගලික අය එහෙම කරන්නේ නැහැ. සමුපකාරය රාත්තලක් සත 45 ට අල ගත්තත්, පෞද්ගලික වෙළෙන්දෝ හුඟක් වෙලාවට රාත්තලකට ශත 60ක් 70ක් අතර ගණණක් ගෙවන බව වයිරවනාදන් මහතා කිව. ඔහු කිවේ සමහර වෙලාවට හොඳ අලවලට රාත්තලකට රුපියලක් විතර ලැබෙන බවයි. මේ තත්වය හින්ද ඒ පළාතේ කොයිම සමුපකාරයකට වත් ගොවියෝ අල විකුණන්නේ නැති බව වයිරවනාදන් මහතා කිව.

ඔහු පෝර බෙහෙත් ආදිය ලබා ගන්නේ සමුපකාර සමිති සංගමයෙනුයි, පෞද්ගලික වෙළඳුන් ගෙනුයි. සමහර වෙලාවට සමුපකාරෙ නැතිවුනාම සත -/20, -/25 ක් විතර වැඩියෙන් මිළ ගෙවල පෞද්ගලික අයගෙන් ලබාගන්න බව ඔහු කිව. පෝර බෙහෙත් ආදිය ලබාගන්න ඒ පළාතේ අයට නම් කිසි කරදරයක් නැති බව ඔහුගේ අදහසයි.

වයිරවනාදන් මහතා ගොවිපලට වතුර ලබා ගන්නේ ළිඳකට හයි කරල තියෙන විදුලි බලයෙන් වැඩ කරන පොම්පයක් මගින්. අවට තියෙන ගොවිපලවල් 10 කට විතර වතුර ලබා ගන්නේ මේ පොම්පය මගින්. එය 10 දෙනෙකුට විතර අයිති බවත් විදුලි ගාස්තුව එම 10 දෙනා අතර බෙදා ගන්නා බවත් වයිරවනාදන් මහතා කියා සිටිය.

අවුරුදු ගණනාවක ඉඳල යාපනේ ගොවිතැන් කරපු කෙනෙක් හැටියට ඒ පළාතේ

ගොවි මහත්වරුන්ට මුහුණ දෙන්න සිදුවන කරදර ගැන කතා කළ වයිරවනාදන් මහතා පැව සුවේ බීජ අල ඕන තරම් කරදරයක් නැතිව ලැබෙනව නම්, එ වගේම එක එක්කෙනාට ඕන කරන හැටියට කලට වේලාවට ණය මුදල් හම්බ වෙනව නම් වෙන ප්‍රශ්නයක් නම් ඒ පළාතේ ගොවි මහත්වරුන්ට නැති බවයි. සමුපකාරයෙන් බීජ අල දෙන්නේ කෘෂිකර්ම උපදේශක මහතා නිර්දේශ කරන අයට විතරයි. බීජ අල හිඟකම හින්ද ඒ පළාතෙ එක අයෙකුට ලැබුනේ හොන්ඩර 2 1/2 ගණනේයි. එම ප්‍රමාණය වගා කරන්න මදි හින්ද සමහර අය කළේ සමුපකාරයෙන් රු. 137/50 ට දෙන බීජ අල පෙට්ටියක් රු. 250/- ගණනේ අනෙක් අයට විකිණීමයි. මේ විදියට බීජ අල වැඩි ගණන කට පිට අයට විකුණපු අය සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කටයුතු කරගෙන යන බව කී වයිරවනාදන් මහතා ඕන තරම් බීජ අල තියෙනව නම් මේ වගේ තත්වයක් ඇති වෙන්නේ නැති බව කිව්ව.

හාල් සලාකය අඩු කිරීම ගැන වයිරවනාදන් මහතා කීවේ එය එක අතකින් ඒ පළාතේ ගොවි මහත්වරුන්ට ලොකු පහරක් බවයි. කුලී කාරයන්ගෙන් වැඩ ගත්තහම ගොවි මහත්වරු ඒ කුලී කාරයන්ට ගාස්තුව හැටියට සල්ලි දෙනව විතරක් නෙවෙයි, දවසේ කෑමත්, තේත් දෙනව. දැන් හාල් හිඟය හින්ද කුලී කාරයන්ට කන්න දෙන්න හුඟක් අමාරු බව ඔහු කියා සිටිය.

පසුගිය අවුරුද්දෙ මිරිස්, අල වලිනුත් හොඳ ආදායමක් ලැබිච්ච හින්ද දැන් නම් ගොවි තැන් කටයුතු ගැන ලොකු ආසාවක් තියෙන බවකී වයිරවනාදන් මහතා ගොවිතැන් කටයුතු වලින් සෑහීමකට පත්වෙලා දැන් ටිකක් අතමිට හිඟයක් නැතුව ජීවත් වෙන කෙනෙක් හැටියට තමා හඳුන්වා දුන්නා.

× × ×

**කොන්ඩාවිල් නැගෙනහිර, ඉරුප්පලායි, සබාරත්නම් කෝපාලන්** මහතා වයස අවුරුදු 28 ක විවාහක තරුණයෙක්. ඔහු දරුවන් දෙදෙනෙකුගේ පියෙක්. කෝපාලන් මහතා ලාච්චම් 24 ක් වැඩ කරනව. මේ ඉඩකඩම් ඔහුට අයිති ඒවා නොවෙයි. ඔහු මේවා වෙනත් අයෙකුගෙන් බදු අරගෙන තියෙන්නේ අවුරුද්දකට රු. 1500/- ක් බදු ගෙවන්නටයි. ඔහුගේ ඉඩ කඩම් වල ලූනු, මිරිස්, අල, දුම්කොල, රාජඅල ආදිය වවල තිබුන අතර මිරිස්, එළවලු, බටු, තක්කාලි, ගෝව අඹ ආදිය වවන තවානකුත් ඔහුට තිබුණා. ඒ වගේම ඔහුට සරු කෙහෙල් වගාවක් ද තිබුනා.

මේ විදියට, ලූනු මිරිස් ආදිය වවන්න ලාච්චම් 24 කට රු. 11,000/- ක් විතර වියදම් වුන බව කෝපාලන් මහතා කිව්ව. ගොවිතැන් කටයුතු වලට ඔහු සල්ලි ණයට ගන්නේ තිරුනෙල් වේලි විවිධ සේවා සමුපකාර සමිතියෙන්. ඔහුට පසුගිය වතාවේ අල වගා කරන්න රු. 640/- ක ණය මුදලක් හම්බ උනා. ඔහු කීවේ මේ වගේ පොඩි මුදලක් ඒ විදියට බෝගජාති වවන්න කොහොමවත් මදි බවයි. ඒ හින්ද 24% පොලීසියට තමන්ගේ රිදී රත්රන් බඩු පෞද්ගලික අයට උගස් තියල සල්ලි ණයට අරගන්න බව ඔහු කියා සිටිය. මෙච්චර පොලියක් ගෙවන එක ලොකු කරදරයක් වුනත් සල්ලි හොයා ගන්න වෙන මාර්ගයක් නැති හින්ද එහෙම කරන බව කෝපාලන් මහතා කීව.

ඔහුගේ ඉඩමේ දෙකෙන් පංගුවක් විතර හරිය තද ගල් සහිත පොළව හින්ද ඒ ගල් කඩා ඉවත් කරන්නට ඔහු හුඟක් වියදම් කරල තියෙනව. මේ විදියට අවුරුදු තුනක ඉඳලම ටික ටික ඒ ගල් ඉවත් කරල වවන්න පුළුවන් හරිය වැඩි කරගන්නව.

කෝපාලන් මහතා ඔහු වවන එළවලු, අල එහෙම තිරුනෙල්වේලි පොලට ගිහින් විකුණ නව. සමහර වෙලාවට මිරිස්, ලූනු ආදිය කොළඹ ඉඳල එන පුද්ගලික වෙළෙන්දන්ට විකුණන බව ඔහු පැවසුව. ඔහු කීවේ තවත් වෙලාවකට ගොවියෝ හතර පස්දෙනෙක් විතර එකට එක්කාසු වෙලා අල, ලූනු, මිරිස් ආදිය කොළඹට ගෙන එන බවයි. සමුපකාරයට ලූනු, මිරිස් අල ආදිය විකුණන එක ලොකු කරදරයක් බව කී කෝපාලන් මහතා ඒ වගේම සමුපකාරයෙන් ගෙවන්නෙත් හුඟක් අඩු මුදලක් බව කියා සිටිය.

තමන්ගේ ගොවිතැන් කටයුතුවලට ඔහු වතුර ලබා ගන්නේ ඉඩමේ අයිතිකාරයා ළිඳකට හයි කරල තියෙන ඉලෙක්ට්‍රික් පොම්පය

කින්. විදුලි ගාස්තුව කෝපාලන් මහතා ගෙව නව. කෝපාලන් මහතා පෝර, කෘමි නාශක ද්‍රව්‍ය ආදිය ලබා ගන්නේ සමුපකාරෙන්. ඔහු කීවේ ඒවා ලබා ගන්නට කරදරයක් නැති බවයි. ඔහුටම අයිති ඉගින යන්ත්‍රයක් තියෙනව. බිම හාන්න ඕන වුනාම ඔහු පෞද්ගලික අයගෙන් ට්‍රැක්ටර් කුලියට ගන්නව.

කෝපාලන් මහතා කෝපායි විදුරු කර්මාන්ත ශාලාවේ වැඩ කරල තියෙනව. ඒ කාල යේ ඔහුට මාසෙකට රු. 325 ක පඩියක් ලැබුන බව ඔහු කීව. ඒ වුනත් ඒ වගෙ මාසෙකට හම්බ වෙන පොඩි මුදලකින් පලක් නැති බවත් ඔහු කිව්ව. ගොවිතැන් කටයුතු කරන එක ඊට වඩා හුඟක් හොඳ බව ඔහු ඕනෑ කමින් කියා සිටිය.

ගොවිතැන් කටයුතුවලදී තමන්ට මුහුණ දෙන්න සිද්ද වෙන ප්‍රශ්න ගැන කතා කළ ඔහු කිවුවේ කුලී වැඩ කරන්න කම්කරුවන් සොයා ගන්න එකනම් ඒ පළාතේ ලොකු කරදරයක් බවයි. ඒ වගේම කම්කරුවෝ නැති හින්දම ඉන්න කම්කරුවො ටික දෙනා කුලිය හැටියට නිතරම ලොකු ගානක් ඉල්ලන බව ඔහු සඳහන් කළා. ඔහු තවත් කීවේ විවිධ සේවා සමුප-කාරයෙන් ගොවිතැන් කටයුතු වලට දෙන ණය මුදල නම් කොහොම වත් ප්‍රමාණවත් නැති බවයි. ඒක නිසා ගිනි පොලී ගෙවන්න හුඟක් වෙලාවට තමන්ට සිද්ද වෙන බව ඔහු පිළි ගත්තා.

පොළව හදන්න ඉස්සර වෙලාම ගොම පෝර යොදන්නට ඕන වුනත් වවුනියාවෙන් ගොම පෝර ලොරියක් ගේන්න රු. 400 ටත් 500 ටත් අතර ගණනක් අය කරන බව ඔහු කිව.

ඒ පළාතට පොදු තවත් කරදරයක් ගැන කතා කළ කෝපාලන් මහතා කීවේ සමහර කාල වලදී සැරෙන් සැරේ තද හුළං වලට ගොවිතැන් කටයුතු විනාශ වෙන බවයි. තමන් ගොවිතැන් කරන දේවල් රක්ෂණය කරන්න පුළුවන් කමක් තියෙනව නම් සල්ලි ගෙවල ඒ වගේ ක්‍රමයකට දායක වෙන්න තමන් කැමති බව කෝපාලන් මහතා කියා සිටිය.

ඒ පළාතේ හාල් සේරුවක් රු. 9/- ටත් වැඩි බව කිවූ කෝපාලන් මහතා හාල් සලාකය අඩු කිරීමෙන් ගොවිතැන් කටයුතු කරන අයට හුඟක් අමාරු තත්වයකට පත්වෙන්න සිදුවන බව සඳහන් කළා. කෝපාලන් මහතා කීවේ කුලී කාරයන්ට කෑම දෙන්න ඕන හින්ද හාල් සලාකය අඩු මිළට ගන්න පුළුවන් වුනේ නැත් නම් ඒක ලොකු හිසරදයක් බවයි.

X X X

**තල්ව්යන්කාඩුහි, නඩරාජා ජයරත්නම්** මහතා අවුරුදු 26 ක තරුණයෙක්. ඔහු සම්මාන 4 ක් ඇතුව ජ්‍යෙෂ්ඨයෙන් සමත් වෙලා ඉන්න තරුණයෙක්. ඔහු ඉගෙන ගෙන ඇත්තේ යාපනේ මධ්‍ය විද්‍යාලයෙයි. ජයරත්නම්මහතා සිංහලෙන් කතා කළා.

1968 සිට ඔහු ලාච්චම් 22 ක් වගා කරනවා. ඔහු කීවේ මේ ඉඩම් ඔහුට දෑවැද්දට ලැබුන ඉඩම් බවයි. ඔහුගේ ඉඩම්වල අල, රතු ලූනු, දුම්කොළ, බොම්බයි ලූනු, වවල තිබුන.

අල වගා කිරීම ගැන කතා කළ ජයරත්නම් මහතා කීවේ 1972 ට ඉස්සර වෙලා නම් බීජ අල ඕන තරම් තිබුන බවයි. 1972 දී ඔහුට බීජ අල හොන්ඩර 10 ක් හම්බ උනා. ඒ උනත් 1973 දී හම්බ උනේ හොන්ඩර 2½ ක් විතරයි. ඒක හින්ද තව හොන්ඩර 7½ ක් විතර බීජ අල සමුපකාරයේ මිළ වගේ දෙගුනයක් ගෙවල පිටින් අරගෙන වැඩ කරන්න සිද්ද වෙච්ච බව ජයරත්නම් මහතා කියා සිටිය.

ඔහුට ලාච්චම 17 ක් වැඩ කරන්න රු. 5,000/- ක් විතර වියදම් වෙලා තියෙනව. ඔහු ණය ගන්නෙත් තිරුනෙල්වේලි විවිධ සේවා සමුපකාර සමිතියෙන්. ඔහුට ණය ලැබුනේ රු. 640/- යි. ජයරත්නම් මහතා කිව්-වේ ඕන වෙලාවට ණය මුදල් ලැබෙන්නේ නැති බවයි. ඔහු කීවේ මිරිස් වවන්න දෙන්නට තියෙන ණය සමහර වෙලාවට ලැබෙන්නේ මිරිස් කරල් කඩන කොට බවයි.

ගොවිතැන් කටයුතු කරන්න මේ දෙන පොඩි ණය මුදල මදි හින්ද ඔහු හුඟක් වෙලාවට රන් රිදී බඩු මහජන බැංකුවට උගස් තියල

සල්ලි ණයට ගන්න බව කියා සිටිය. සමහර වෙලාවලට පිට අයටත් මේ බඩු උගස් තියල ඔහු සල්ලි ණයට ගන්නව. එතකොට පොලිය හැටියට 24 % ක් විතර ගෙවන්න සිද්ද වෙන බව ජයරත්නම් මහතා කියා සිටිය. හුඟක් වෙලාවට පිට අය ළඟ රත්රන් රිදී බඩු උගස් තියපුහම සල්ලි ණයට දෙන්නේ පළමුවැනි මාසයේ පොලියත් අයකරගෙන බව ඔහු කියා සිටිය.

ජයරත්නම් මහතා තමාගේ බෝග වර්ග විකුණන්නේ පිට අයටයි. ඔහු කිව්වේ විවිධ සේවා සමුපකාර සමිතිවලට ඒව විකුණන්නේ නැත්තෙ ගෙවන මිල අඩු හින්දත් විකුණන්න ගියාම තියෙන කරදරේ හින්දත් බවයි. කොළඹට ගෙනල්ලා විකුණන්න ගියාම ලොරි කුලිය පටවන බාන කුලි, බ්‍රෝකර් ගාස්තු ආදිය අඩුකර ගත්තහම තමන්ගේ අතට හම්බ වෙන්නේ ටිකක් වුනත් පිට අයට දෙන්නේ ඒ වෙලාවෙම සල්ලි ලබාගන්න පුළුවන් හින්ද බව ඔහු කියා සිටිය. ජයරත්නම් මහතා තව දුරටත් කිවුවේ සමුපකාරයට බඩු වික්කත් සල්ලි ගන්න ගියාම සමහර වෙලාවට මාස ගණන් බලා ඉන්න සිද්ද වෙන බවයි.

ජයරත්නම් මහතා ලංකා බැංකුවෙන් රු. 5,000/-ක් ණයට අරගෙන ඉලෙක්ට්‍රික් පොම්පයක් මිළදී ගෙන තියෙනව. ඔහු කීවේ ඒ ණය ආපසු ගෙවන එක වැඩි කරදරයක් නොවන බවයි.

කලින් ජයරත්නම් මහතා මොකක් හෝ රස්සාවක් කරන්න එංගලන්තයට යන්න අදහස් කළ බවත් ඒ ගමනේ මූලික වැඩ කටයුතු ටික ඉවර වෙනකල් නිකමට වාගේ ගොවිතැන් කටයුතු පටන් ගත්ත බවත් ඔහු කීව. දැන් නම් ඔහු මොනම රස්සාවකටවත් ගොවිතැන අත් හරින්නේ නැති බව තරයේම කියා සිටියා. ඉස්සර නම් ගොවිතැන් කරනවා කියන්න ටිකක් අදි මදි කළත් දැන් ලොකු ආඩම්බරයක් ඇතිව තමන් ගොවිතැන් කරන කෙනෙක් බව ඕන තැනක කීමට පුළුවන්යයි ජයරත්නම් මහතා කීව.

ඒ පළාතේ ගොවිතැන් කරන අය අතර තට්ටු මාරු ක්‍රමය ඉඩම් භුක්ති ක්‍රමයකුත් තියෙනව. ඒකට කියන්නේ 'ඔට්ටි' කියලයි. සල්ලි



රස්සාවක් හැටියට ගොවිතැන් කරන බව දැන් ආඩම්බරයෙන් කියන්න පුළුවන් යැයි පවසන ජයරත්නම් මහතා

තියෙන කෙනෙක් සමහර වෙලාවට ඉඩමකට සල්ලි දෙනව. ඉන් පස්සේ ඉඩම ආපහු දෙන්නේ ගොවිතැන් කරල. ඒ මුදල් පිය වෙනකන් ඔහුට පුළුවන් ඒ ඉඩමේ ගොවිතැන් කරන්න මේ ක්‍රමයට තමයි 'ඔට්ටි' කියල කියන්නෙ.

ළඟකදී ඉඳන් ගොවිතැන් කටයුතු පටන් ගත්තත් ඒ වගේ ගොවිතැන් කටයුතු වලට ලොකු උනන්දුවක් දක්වන තරුණයෙක් හැටියට ජයරත්නම් මහතා ඔහුට මුහුණ දෙන්න සිද්ද වෙන කරදර ගැනත් කතා කළා. ඔහු කීවේ ගොවිතැන් කටයුතු වලට දෙන ණය මුදල නම් හුඟක් මදි බවයි. ඒ වගේම රතු ලූනු, වගේ ඒවට පාලන මිලක් තියෙනව නම් ඒකත් හොඳ බව ඔහුගේ අදහසයි. ඔහු මේ විදියට කිව්වේ එක දවසක රතුලූනු විතරක් ලොරි 20 ක් 25 ක් කොළඹට ගියොත් ලූනුවල ගණන හුඟක් අඩු වෙන හින්ද බව ජයරත්නම් මහතා කීව. මේ වගේ පොඩි පොඩි ප්‍රශ්න තිබුනත් ලොකු ආසාවක් ඇතුව ගොවිතැන් කටයුතු කරගෙන යන බව ජයරත්නම් මහතා කියා සිටිය.

× × ×

**තෙලිප්පලායි, කම්පනායි, ආරුමුගම් බාල සුබ්‍රමනියම්** මහතාගේ වයස අවුරුදු 28 යි. ඔහුගේ මල්ලී ආරුමුගම් රාජරත්නම් වයස අවුරුදු 26 ක තරුණයෙක්. මේ දෙන්නම තෙලිප්පලායි මහජන විද්‍යාලයේ ඉගෙන ගෙන තිබෙනව. මේ සහෝදරයො දෙන්නත් ඒ

පළාතේ ලාච්චම් 30 ක් වැඩ කරනව. 1965 ඉඳල ගොවිතැන් කටයුතු කරන මේ දෙන්නට අයිති ඉඩ කඩම් නැහැ. අවුරුද්දකට රු. 550/- ක් බදු ගෙවන්න ඒ ඉඩම බදු අරගෙන තියෙන්නේ පිටස්තර කෙනෙකුගෙන්. ඔවුන් කීවේ බැරිවෙලාවත් හරි වෙලාවට බදු නොගෙවුවොත් ඉඩම් අයිති කාරයා කොළඹ ඉඳලම ඇවිත් බදු මුදල විතරක් නෙවෙයි ඔහුගේ ගමන් ගාස්තුවක් ඉල්ලන බවයි. ඔවුන්ගේ ගෙවත්තේ ලාච්චම් 8 ක් විතර තියෙනව. ඔවුන් කීවේ එහි සියඹලා ගස් තියෙන හින්ද වෙන මොනම දෙයක් වත් වවන්න බැරි බවයි. ඒ වුනත් සියඹලා වලින් අවුරුද්දකට රු. 500 ක විතර ආදායමක් ලැබෙන බව ඔව්හු කියා සිටිය.

ඔවුන් කියන හැටියට ඒ පළාතේ ට්‍රැක්ටර් නැහැ. ඒක නිසා බිම හාන්න හරක් යොදව ගන්න බවත් ඒ ඉඩම්වලට යන එන පාරත් හොඳ නැති හින්ද ට්‍රැක්ටර් තිබුනත් ඒවා ඉඩමට ගන්න බැරි බවත් ඔවුහු කීව.

බාල සුබ්‍රමනියම් මහතා පසුගිය කන්නේ කොම්පැනියකින් අරගත්ත බෙහෙත් ඉසින යන්ත්‍රයක් වැඩ කරන කොට පුපුරල ලොකු කරදරයකට මුහුණ දුන්න බව කිව. තවමත් ඒක අලුත්වැඩියා කර ගන්න බැරි වුන බව බාලසුබ්‍රමනියම මහතා කියා සිටිය.

පහුගිය වාරෙ ගොවිතැන් කටයුතු කරන්න මේ අය තෙලිප්පලායි විවිධ සේවා සමුපකාර සමිතියෙන් රු. 800/- ක් ණයට ගත්ත. දැන් ඒ ණය මුදල් ගෙවල ඉවරයි. මේ පාර ණය ඉල්ලුවේ නැත්තේ ණය ඉල්ලුම් පත්‍රයේ සහතික කරන්න ඇපකරුවෝ හොයා ගන්න බැරි වෙච්ච හින්ද බව ඒ හෝදරයෝ දෙන්න පැවසුව.

ඔවුන් දැන් ලූනු වවල තියෙන්නේ කලින් වී ගොවිතැන් කරපු කුඹුරකයි. ඉලක්කනම් කට්ටායි කියන වැව උතුරල ඇල මාර්ග දිගේ වතුර ඇවිත් ඒ බිම යටවෙන හින්ද කුඹුරු වැඩ කරන එක ලොකු කරදරයක් බව බාලසුබ්‍රමණියම් මහතා ප්‍රකාශ කළා. ඇල මාර්ගවල් හොඳින් සුද්ද පවිත්‍ර කරල නැති හින්ද වතුර ටික ආපසු බැහැගෙන යන්නේ නැතැයි ඔවුහු වැඩිදුරටත් කීව. මේ තත්වය කීප සැරයක්ම ගොවි කාරක සභාවට දන්වුවත් කිසිම වැඩක් වුනේ නැති බව මේ සහෝදරයො දෙන්නම ප්‍රකාශ කළා. වතුර කලට වේලාවට ලබාගන්න පුළුවන් ක්‍රමයක් තියෙනව නම් ඔවුන් වී වගා කරන්න කැමති බව ඒ දෙදෙනා වැඩි දුරටත් කීව.

මේ තත්වය හින්ද ඔවුන්ගේ ලූනු වගාවට වතුර වත්කරන්නේ ළිඳකින්. ඒ ළිඳෙන් වතුර ගන්න පුළුවන් දවසක් ඇර දවසකටයි. එහෙම කරන්නේ අනෙක් අයටත් ඒ ගොල් ලන්ගේ වගා වලට වතුර ලබා ගන්න ඉඩ දෙන්න ඕන හින්දයි.

ඒ පළාතේ තැනින් තැන කීප දෙනෙක් අතර වතුර පොම්ප තිබුණත් ඒවා තියෙන්නේ ටිකක් හින්ද කුලිය හැටියට ලොකු ගණනක් අය කරන බව බාලසුබ්‍රමනියම් මහතා පැවසුව.

ගොවිතැන් කටයුතු වලින් ලොකු සන්තෝෂයක් තමන්ට ලැබෙන බවත් ණය පහසුකම් ආදිය ලබා දෙනව නම්, ඒ වගේම ඉඩකඩම් කොහෙන් හරි දෙනව නම් යාපනේ ඕන තැනක ගිහින් ගොවිතැන් කරන්න කැමති බව මේ සහෝදරයො දෙන්නම තරයේම කියා සිටිය.

තෙලිප්පලායි පළාතේ හාල් සේරුව රු. 8/- ක් විතර හින්ද සලාකය අඩු කිරීම අතින් නම් ටිකක් කරදර සහිත තත්වයක් ඇති බව මේ දෙන්නම ප්‍රකාශ කළා. කුරක්කන්, මයියොක්කා ආදිය තමන්ට තියෙන හින්ද වැඩිම කරදරයක් නොවුවත් මේවාත් නැති අයට හාල් නැතිකම ලොකුම ප්‍රශ්නයක් බව ඔවුන්ගේ අදහසයි.

ආණ්ඩුවෙන් රස්සාවක් ලැබෙනව නම් ඒකට යාමට තමන් කැමති බව ඔව්හු කියා සිටිය. ඒ දෙන්නම ඒ විදියට කීවෙ පිළිවෙලකට ගොවිතැන් කරන්න නම් තමන්ගේම ඉඩම් තියෙන්න ඕන හින්දයි. ඔවුන් කීවේ වෙනත් අයිතිකරුවෙකුගේ ඉඩම් කොච්චර කලක් ගොවිතැන් කළත් ඒ අය කියපු වෙලාවට ඒ ඉඩම අත්හැරල යන්න සිද්ද වෙන බවයි.

**තෙලිප්පලායි, 'පොන් අරන්'හි, පී. කනපති පුල්ලේ** මහතා විශ්‍රාම ලත් ගුරුවරයෙක්. ඔහුගේ වයස අවුරුදු 60 යි. ඔහු බොහොම අමාරුවෙන් ඉතුරු කර ගත්ත සල්ලි ටිකත් වියදම් කරල ලාච්චම් 30 ක් අරගෙන බොම්බයි ලූනු, රතු ලූනු, කෙහෙල් ආදිය වවල තියෙනව. ඔහු කීවේ අල වැවුවෙ නැත්තෙ සල්ලි නැති හින්ද බවයි.

1968 මුල් කාලයේදී ඒ ඉඩමේ ළිඳක් කපන්න රු. 5,000/- ක් පමණ වියදම් වෙන බව කියල ඒකට ආධාර ඉල්ලල ඉල්ලුම් පත්‍රයක් නොයෙකුත් තැන්වලට ඉදිරිපත් කළත් කිසිම ආධාරයක් කොයි පැත්තකින් වත් තමාට හම්බ උනේ නැති බව කනපතිපුල්ලේ මහතා කීව. ඔහු කීවේ මේ තත්වයෙන් තමාගේ බලාපොරොත්තු කඩවෙච්ච ස්වභාවයකට පත් වුන බවයි. අන්තිමේ දී ඔහු ඔහුගේ ම සල්ලි වලින් රු. 5,000/- ක් වියදම් කරල ළිඳක් කැපුව. කනපතිපුල්ලේ මහතා මේ ළිඳ කැපුවේ තම බිරිඳගේත්, ළමයින්ගෙන් කනකර අබරණ උගස් තියල සල්ලි හොයා ගෙන බව කියා සිටිය. ඔහු කීවේ දැනුත් විශ්‍රාම වැටුප් ලැබුනහම ඒවායේ පොලිය ගෙවන බවයි.

ඔහුට ලාච්චම් 30 ක් තිබුණත් එහි ගොවිතැන් කරල තිබුනේ තැනින්තැන ටික ටිකයි. ඔහු කීවේ ඔහු එහෙම කළේ ලොකුවට ගොවිතැන් කරන්න සල්ලි ලබා ගන්න බැරි වෙච්ච හින්ද බවයි. ඉස්සර වෙලාම ණය හම්බ වුනේ නැතුවට පස්සේ මොනම ණය මුදලක් වත් ආණ්ඩුවෙන් ඉල්ලුවේ නැති බව ඔහු කීව.

ඔහු වවන ලූනු මිරිස් ආදිය ඔහුගේ බයිසිකලයේ ගෙනිහිල්ල චුන්නාකම් මාර්කට්එකට විකුණන බව කනපතිපුල්ලේ මහතා කියා සිටිය.

ඔහු අවසාන වශයෙන් කියා සිටියේ ගොවිතැන් කරන අයට පහසුවෙන් සල්ලි ණයට අරගන්න පුළුවන් හැටියට ණය පහසුකම් සැළසෙන්නේ නැත්නම් මොන විදියකවත් ගොවිතැන් කටයුතු දියුණු කරන්න බැරි බවයි.


**ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාවේ**

**වසරක ප්‍රගතිය**

**මහත් අභිමානයෙන් ඉදිරිපත් කරයි**

**ලාංකික තරුණ තරුණියන් 22,000 කට රැකියා-**
**ඔවුනට රජයේ නියමිත වැටුප් සහ අර්ථ සාධක අර මුදල්--**
**දුම්කොළ වවන ගොවීන් අතට රුපියල් එක් කෝටි විසි ලක්ෂයක්- (1,20,00,000)**
**රජයේ භාණ්ඩාගාරයට රුපියල් කෝටියක් (1,00,00,000)**
**ආහාර වගාවට අක්කර දහසක් (1,000)**

**ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව**

අලෙවි අංශය,
146, වෙල්ල වීදිය,
කොළඹ 12.
දුරකථනය: **35174**

ප්‍රධාන කාර්යාලය,
203/7, ධර්මපාල මාවත,
කොළඹ 7.
දුරකථනය: **94281**